# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2065/29 - 2018 අප්‍රේල් මස 04 වැනි බදාදා - 2018.04.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

උතුරු පළාතේ පළාත් සභාව

**2017 අංක 06 දරන උතුරු පළාත් බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය**

උතුරු පළාත් පළාත් සභාව විසින් 2017 වර්ෂයේ ජුනි මස 22 වෙනි දින සම්මත කරන ලද 2017 වර්ෂයේ අංක 06 දරන උතුරු පළාත් බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය සඳහා උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2018 වර්ෂයේ මාර්තු මස 26 වෙනි දින අනුමැතිය ලබා දී තිබෙන බව මෙයින් දැනුවත් කරනු ලැබේ.

**කේ. තෙයිවේන්ද්‍රම්,**
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2018 මාර්තු මස 27 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
ඒ 9 මාර්ගය,
කයිතඩි.

1A PG 3973 – 27 (2017/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 06 දරන උතුරු පළාත් බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය**

**උතුරු පළාත තුළ බඩු උකස්ගන්නන්ගේ ව්‍යාපාරය විධිමත් කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි මෙම ප්‍රඥප්තිය (99 වන අධිකාරය වූ) බඩු උකස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන හා අනනුකූල වේ.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාත් සභාව විසින් මෙලෙස ප්‍රඥප්ති පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

01. මෙම ප්‍රඥප්තිය 2017 අංක 06 දරණ උතුරු පළාත් බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෙම ප්‍රඥප්තිය සඳහා උතුරු පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාදෙනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

මෙම ප්‍රඥප්තියේ අදාළත්වය.

02. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන බැංකු හැර යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන බඩු උගස්ගන්නන්ගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළවිය යුතු ය.

## I වන කොටස
## ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබාදීම

බඩු උකස්ගන්නකු ලියාපදිංචි කිරීම.

03. උතුරු පළාතේ ආදායම් බදු කොමසාරිස්වරයා (මෙහි මින්මතු "පළාත් කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත බඩු උකස්ගන්නකු වශයෙන් ලියාපදිංචි වී ඇත්නම් මිස, කිසිදු තැනැත්තකු විසින් බඩු උගස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සිදු නොකළ යුතු ය.

ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීම.

04. (1) බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කරනු ලබන සෑම තැනැත්තකුම ලියාපදිංචි වීම සඳහා නියමිත ආකෘතිය අනුව වූ ඉල්ලීමක් නියමිත ගාස්තුව සමඟ පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන යම් පුද්ගලයකු හෝ විදේශීය සමාගමක් හෝ විදේශීය ව්‍යාපාර ආයතනයක් උතුරු පළාත තුළ බඩු උගස්ගන්නකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

(2) *(අ)* යම් වෙන්දේසිකරුවකු වන්නා වූ;

*(ආ)* ලියාපදිංචි කිරීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව ම වූ අවුරුදු පහක කාලය ඇතුළත යම් ඕනෑම අවස්ථාවක දී යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු බවට තීරණය කරනු ලැබ ඇති; හෝ

*(ඇ)* පළාත් කොමසාරිස්වරයාගේ මතය අනුව, බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා යම් තැනැත්තකු අපේක්ෂා කරනු ලබන සාප්පුව හෝ ස්ථානය හෝ ඔහු සන්තකයේ තිබෙන යම් යාබද නිවසක් හෝ ස්ථානයක් බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සුදුසු නොවන විට.

එවැනි කිසිදු තැනැත්තකු බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි නොකළ යුතු ය.

බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය සඳහා බලපත්‍ර ලබාදීම.

5. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ ඉන්පසු 4 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති කිසිදු තැනැත්තකු ඒ කාර්යය සඳහා පළාත් කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ හැර යම් බඩු උගස් ගන්නකුගේ ව්‍යාපාරයක නියැලීම සිදු නොකළ යුතු ය.

(2) 4 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකු ම සෑම ව්‍යාපාර ස්ථානයක් හා ශාඛාවක් සඳහා වෙනම බලපත්‍රයක් ලබා ගැනීම පිණිස වෙනම ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

(3) සෑම බලපත්‍රයකම දිනය වශයෙන් එය නිකුත් කරන ලද දිනය යෙදිය යුතු අතර, ඉන්පසුව එළඹෙන දෙසැම්බර් මාසයේ තිස් එක වන දින එහි වලංගුභාවය අවසාන වන්නේ ය.

(4) පළාත් කොමසාරිස්වරයා වෙත බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාර සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ වන ඔහුගේ අධිකාරිය ලිඛිතව යම් බලයලත් නිලධරයකු වෙත අභිනියෝජනය කිරීම සඳහා බලතල තිබිය යුතු ය.

06. (1) 4 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා වන සෑම ඉල්ලීමක්ම පළාත් කොමසාරිස්වරයා වෙත නියමිත ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය. බලපත්‍රයක් සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ආකාරය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක ම සියලු නියමිත විස්තර පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි තොරතුරු ඇතුළත් විය යුතු අතර නියමිත ගාස්තුව සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) බඩු උගස්ගන්නකුගේ ව්‍යාපාරය යම් පුද්ගලයකු විසින් සිදු කරනු ලබන විට සහ ඔහුගේ මරණයෙන් පසුව එම බඩු උගස්ගන්නකුගේ ව්‍යාපාරය යම් තැනැත්තකු වෙත පැවරීමට ඔහු අදහස් කරනු ලබන විට, එම පුද්ගලයා 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව යම් තැනැත්තකු නම් කළ යුතු ය.

(ආ) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීම සමඟ එම නම් කරන ලද තැනැත්තාගේ අයිතිවාසිකම් හා වගකීම් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කළ යුතු ය. එම ලේඛනය දෙපාර්ශ්වය විසින් අත්සන් කළ යුතු ය.

(4) බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන විට එම සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලය විසින් ඒ පිළිබඳ අදාළ සහතිකයේ හෝ ගිවිසුමේ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලීමෙහි ඇතුළත් තොරතුරු හා විස්තර සලකා බැලීමෙන් පසුව, 4 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීමේ යෝග්‍යතාව සම්බන්ධයෙන් නියම කරන ලද නියමයන් ඉල්ලුම්කරු විසින් සපුරා ඇති බවට පළාත් කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ "අ" ආකෘතිය අනුව වූ යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු හෝ විස්තර ඇතුළත් යම් ඉල්ලුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

07. (1) සෑම බඩු උකස්ගන්නකු විසින් බලපත්‍රය ලැබුණු වහාම නමුත් බඩු උගස්ගන්නකුගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ඇප වශයෙන් නියම කරන ලද මුදල නියම කරන ලද ආකාරයෙන් පළාත් කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු ය. ඇප.

(2) ව්‍යාපාරය වසා දැමීමේ දී හෝ පැවරීමේ දී, (1) වන උපවගන්තිය ප්‍රකාර තැන්පත් කරන ලද මුදල එම බඩු උකස්ගන්නා විසින් යම් බඩු උකස්කරන්නකු වෙත ගෙවිය යුතු යම්මුදලක් අඩුකිරීමෙන් පසුව එම බඩු උකස්ගන්නා වෙත ආපසු ගෙවිය යුතු ය.

08. 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් - බලපත්‍රයේ ආකෘතිය හා කාලසීමාව.

*(අ)* බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය;

*(ආ)* බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය; සහ

*(ඇ)* කලින් අවලංගු කරන ලදහොත් මිස, බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාව සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

09. (1) 6 වන වගන්තිය යටතේ කලින් නිකුත් කරන ලද යම් බලපත්‍රයක්, එම බලපත්‍රයේ කල් ඉකුත් වන දිනයට දින තිහකට නොඅඩු කාලයකට පෙර නියමිත ආකෘතිය අනුව වූ ඉල්ලීමක් නියමිත අළුත් කිරීමේ ගාස්තුව සමඟ පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අළුත්කරවා ගත හැකි ය. බලපත්‍රයක් අළුත් කරවා ගැනීම.

(2) එම බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පිළිබඳ පෙරාතුව ම වූ මුදල් වර්ෂය සඳහා වන වාර්ෂික ගිණුම් ප්‍රකාශයේ පිටපතක් (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන බලපත්‍රය අළුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලීම සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) පළාත් කොමසාරිස්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට -

*(අ)* බලපත්‍රලාභියා විසින් නිකුත් කරන ලද බලපත්‍රයේ නියම හා කොන්දේසි උල්ලංඝනය කර නොමැති විට හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියාකර නොමැති විට;

*(ආ)* බලපත්‍රලාභියා විසින් මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කඩකර නොමැති විට;

*(ඇ)* එම බලපත්‍රය ලබාගැනීම සඳහා වන ඉල්ලීම ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව ම වූ වර්ෂ පහක කාලසීමාව තුළ යම් ඕනෑම අවස්ථාවක දී ඔහු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ නොමැති විට;

*(ඈ)* පළාත් කොමසාරිස්වරයාගේ මතය අනුව යම් තැනැත්තකු බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කරනු ලබන සාප්පුව හෝ ස්ථානය හෝ ඔහුගේ සන්තකයේ තිබෙන යම් යාබද නිවසක් හෝ ස්ථානයක් බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සුදුසු වන්නා වූ විට; හෝ

*(ඉ)* පළාත් කොමසාරිස්වරයාගේ මතය අනුව, බලපත්‍රය දරනු ලබන තැනැත්තා, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන විට, සහ බඩු උකස්ගන්නකු වශයෙන් ඔහුගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ විධිවිධානවල කාර්ය සඳහා සහ එහි අධ්‍යාශයට පටහැනි වන අයුරින් ක්‍රියාකර නොමැති විට.

බලපත්‍රයක් අළුත් කරනු ලැබිය හැකි ය.

(4) 7 වන වගන්තියේ විධිවිධාන මෙම වගන්තිය යටතේ බලපත්‍රයක් අළුත් කිරීමේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීම.

10. 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් පළාත් කොමසාරිස්වරයා විසින් පහත හේතු මත අත්හිටුවනු ලැබිය හැකි ය -

*(අ)* බලපත්‍රලාභියා විසින් මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් සිදුකර ඇති බවට චෝදනා ලබා ඇති විට; හෝ

*(ආ)* බලපත්‍රලාභියා විසින් මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කඩකර ඇති විට සහ එම කඩ කිරීමෙහි බරපතලභාවය බලපත්‍රය අවලංගු කිරීම සඳහා හේතුවක් නොවන්නා වූ විට,

බලපත්‍රයක් අවලංගු කිරීම

11. 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් -

*(අ)* බලපත්‍රලාභියා විසින් සාවද්‍ය, නොමඟ යවන සුළු හෝ වැරදි සහගත තොරතුරු ලබාදීමෙන් ලබාගෙන ඇති බවට තීරණය කර ඇති විට;

*(ආ)* බලපත්‍රලාභියා මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග යටතේ යම් වරදක් සඳහා හෝ ඔහුගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් වංචාවක් සඳහා හෝ සොරකම් කරන ලද භාණ්ඩ බවට දැන දැනම සොරකම් කරන ලද භාණ්ඩ ලබා ගැනීම සම්බන්ධයෙන් හෝ වරදකරු කරනු ලැබ ඇති විට;

*(ඇ)* බලපත්‍රලාභියා යම් ලිඛිත නීතියක් යටතේ වන යම් වරදක් සඳහා වරදකරු කර ඇති විට;

*(ඈ)* බලපත්‍රලාභියා විසින් මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝග කඩකර ඇති විට; හෝ

*(ඉ)* බලපත්‍රලාභියා විසින් එම බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එකී නියම හෝ කොන්දේසි කඩවන හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කරනු ලැබ ඇති විට,

පළාත් කොමසාරිස්වරයා විසින් බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) නිකුත් කරන ලද යම් බලපත්‍රයක් මෙම වගන්තිය හෝ 10 වන වගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද විට, එම අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව එම බලපත්‍රලාභියා විසින් ලබාදෙන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් වහාම දැනුම් දීම පළාත් කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

හේතු දැනුම් දිය යුතු බව.

12. අවස්ථාවෝචිත පරිදි, 6 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කරවා ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති විට එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු පළාත් කොමසාරිස්වරයා විසින් වාර්තා කළ යුතු ය. එම ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු ඉල්ලීමේ සඳහන්

ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැනුම්දීමක් මඟින් එම ඉල්ලීම ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත එම ඉල්ලීමේ දින සිට දින තිහක් ඇතුළත දැනුම් දීම පළාත් කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

13. (1) අවස්ථාවෝචිත පරිදි, යම් බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අළුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා හෝ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම සඳහා ගනු ලබන යම් තීරණයකින් අතෘප්තියට පත්වන යම් තැනැත්තකුට එම ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව ලිඛිත දැනුම්දීම එම තැනැත්තා වෙත ලැබුණු දින සිට මාස තුනක් ඇතුළත එම තීරණයට එරෙහිව ප්‍රධාන ලේකම්වරයා වෙත අභියාචනා කළ හැකි ය. අභියාචනා

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ තීරණය එම අභියාචනය ලැබුණු දින සිට දින හැටක් ඇතුළත ලබාදිය යුතු අතර එම අභියාචනය ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙත ඒ පිළිබඳ තීරණය වහාම දැනුම් දිය යුතු ය.

(3) ප්‍රධාන ලේකම්වරයා විසින් උචිත යයි සලකනු ලබන විට, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් පිළිබඳව යම් තීරණයකට එළඹීමට පෙර අදාළ සිද්ධියේ අවස්ථාගත කරුණු අනුව අවශ්‍ය යයි සලකනු ලබන යම් පරීක්ෂණයක් ඔහු විසින් පවත්වනු ලැබිය හැකි ය.

(4) මෙම වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන යම් අභියාචනයක් පිළිබඳ ප්‍රධාන ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

14. (1) පළාත් කොමසාරිස්වරයා විසින් ඉහත 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක පිටපතක්, එම බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කරනු ලබන්නේ යම් ප්‍රදේශයක් තුළ ද එම ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයා වෙත යැවිය යුතු ය. බලපත්‍රයේ පිටපතක් පොලිස් අධිකාරිවරයා වෙත යැවිය යුතු බව.

(2) බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පවත්වාගෙන යන ලද්දේ යම් ප්‍රදේශයක් තුළ ද එම ප්‍රදේශය භාර පොලිස් අධිකාරිවරයා වෙත අවස්ථාවෝචිත පරිදි, 10 වන වගන්තිය හෝ 11 වන වගන්ති යටතේ බලපත්‍රයක් එසේ අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව දැනුම්දීම පළාත් කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

15. 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් දරන්නකු විසින් පළාත් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව එම බලපත්‍රය අදාළ වන්නා වූ බඩු උකස්ගන්නාගේ එම ව්‍යාපාරය නොපැවරිය යුතු ය. පළාතේ කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතියක් නොමැතිව බලපත්‍රයක් පැවරීම නොකළ යුතු බව.

16. පළාත් කොමසාරිස්වරයා විසින්, බලපත්‍රලත් බඩු උකසගන්නාගේ නම, ව්‍යාපාර ස්ථානයේ නම සහ බඩු උගස්ගන්නාගේ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයේ ලිපිනය ඇතුළත් දැන්වීමක් වාර්ෂිකව රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය. බලපත්‍රලාභියාගේ විස්තර පළ කිරීම.

## II වන කොටස

## බඩු උකස්ගන්නාගේ බලතල, කර්තව්‍ය හා කාර්ය

17. මාස තුනකට වැඩි යම් කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමට අපේක්ෂා කරනු ලබන සෑම බඩු උකස්ගන්නකු විසින් ම - ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම පිළිබඳව දැනුම් දීම.

*(අ)* පළාත් කොමසාරිස්වරයා වෙත විදේශගත වීම සඳහා වන අදහස පිළිබඳව ලිඛිත දැනුම්දීමක් ලබා දී ඒ සඳහා පළාත් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය.

*(ආ)* ශ්‍රී ලංකාවේ ඔහු නොසිටින කාලය තුළ දී බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව යම් තැනැත්තකු නම් කළ යුතු ය.

බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන වේලාවන්.

18. කිසිදු බඩු උකස්ගන්නකු විසින් යම් දිනක පෙ. ව. 8.00 ට පෙර සහ ප. ව. 8.00 න් පසු කිසිදු භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාර නොගත යුතු ය.

බඩු උකස්ගන්නා වෙන්දේසිකරුවකු වශයෙන් ක්‍රියා නොකළ යුතු බව.

19. කිසිදු බඩු උකස්ගන්නකු විසින් වෙන්දේසිකරුවකුගේ ව්‍යාපාරය පවත්වාගෙන නොයා යුතු ය.

බඩු උකස්ගන්නා විසින් දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු බව.

20. සෑම බඩු උකස්ගන්නකු විසින් ම -

*(අ)* ඔහුගේ සාප්පුවේ හෝ ව්‍යාපාර ස්ථානයේ පිටත දොරේ ඔහුගේ ව්‍යාපාරයේ නම, බලපත්‍ර ලියාපදිංචි අංකය සහ "බඩු උකස්ගන්නා" යන වචනය දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පැහැදිලි අකුරින් ප්‍රදර්ශනය කළ යුතු ය.

*(ආ)* මෙම ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ දක්වා ඇති විස්තර ඇතුළත් යම් දැන්වීමක් දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් එම ස්ථානයට පැමිණෙන සෑම තැනැත්තකුට ම පැහැදිලිව දැකිය හැකි හා පැහැදිලි වන අයුරින් ඔහුගේ ව්‍යාපාර ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

බඩු උකස්ගන්නන් විසින් තබාගත යුතු පොත්, ආකෘති පත්‍ර හෝ ලේඛන

21. (1) මෙම ප්‍රඥප්තිය මඟින් යම් පොතක, ආකෘති පත්‍රයක හෝ ලේඛනයක යම් විස්තර ඇතුළත් කළ යුතු බවට නියම කර ඇති විට එම විස්තර දෙමළ හෝ සිංහල භාෂාවෙන් ඇතුළත් කළ යුතු ය.

(2) සෑම බඩු උකස්ගන්නකු විසින් ම මෙම ප්‍රඥප්තියේ 1 වන උපලේඛනයේ දක්වා ඇති "ආ" ආකෘතිය අනුව වූ ඔඩපන පිළිබඳ පොතක් සහ "ඇ" ආකෘතිය අනුව වූ ඔඩපන පිළිබඳ විකුණුම් පොතක් පවත්වාගෙන යා යුතු අතර එහි අදාළ සියලු විස්තර ඇතුළත් කළ යුතු ය.

(3) එසේ කළ යුතු බවට නියම කර ඇති විට ඒවා පළාත් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කිරීම බඩු උකස්ගන්නකුගේ කාර්යය විය යුතු ය.

උකස් ලදුපත

22. (1) සෑම උකස් ලදුපතක් ම මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ දක්වා ඇති "ඈ" ආකෘතිය අනුව විය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති විස්තර, මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ "ඈ" ආකෘති පත්‍රයේ පසු පිටේ දෙමළ හෝ සිංහල භාෂාවලින් පැහැදිලිව මුද්‍රණය කළ යුතු ය.

(3) යම් ඔඩපනයක් උකස් කරන ලද විට, එම ඔඩපනයට අදාළ උකස් ලදුපතේ පත්‍රිකාවෙහි එම ලදුපතේ නියම කරන ලද වටිනාකමට මුද්දර ගාස්තු අලවා තිබිය යුතු ය. එම මුද්දර ලබාදීමේ දී දරනු ලබන වියදම් බඩු උකස්ගන්නා විසින් දැරිය යුතු ය.

(4) යම් භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාරදෙනු ලබන විට -

*(අ)* උකස් ලදුපතේ උප පත්‍රිකාව උකස්කරු විසින් අත්සන් කළ යුතු ය;

*(ආ)* බඩු උකස්ගන්නා විසින් උකස් ලදුපතේ මුල් පත්‍රිකාව අත්සන් කොට උප පත්‍රිකාව උකස්කරු වෙත ලබාදිය යුතු ය;

*(ඇ)* උකස්කරු විසින් උකස් ලදුපතේ මුල් පත්‍රිකාව උකස්ගන්නාගෙන් භාරගෙන, එය පිළිගත යුතු ය; සහ

*(ඈ)* වාර්ෂික පොළිය උකස් ලදුපතේ නිශ්චිතව සඳහන් කළ යුතු ය.

පොළිය.

23. කිසිදු බඩු උකස්ගන්නකු විසින් මෙම ප්‍රඥප්තියේ II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයන් ඉක්මවා යම් පොළියක් අය නොකළ යුතු ය.

එසේ වුව ද, යම් ඔඩපනයක් මත ලබාදෙනු ලබන ණය මුදලක් සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ගෙවිය යුතු වන විට, මෙම වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධානවල කුමක් සඳහන් වුව ද උකස්කරුගෙන් එවැනි බද්දක් ආපසු අයකර ගැනීම සඳහා මෙමඟින් බඩු උකස්ගන්නා හට තහනම් කරනු ලබන බවට සලකනු නොලැබිය යුතු ය.

## III වන කොටස
### ඔඩපන

24. සෑම ඔඩපනයක්ම උකස් කරනු ලබන දිනය හැර (මෙහි මින්මතු "බේරුම් කිරීමේ කාලසීමාව" යනුවෙන් සඳහන් කරනු ලබන) උකස් කරනු ලබන දිනයේ සිට මාස දොළහක කාලසීමාව ඇතුළත බේරුම් කරගත යුතු ය. *බේරුම් කිරීමේ කාල සීමාව.*

25. මෙම ප්‍රඥප්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, සෑම ඔඩපනයක්ම බේරුම්කිරීමේ කාලසීමාව ඉකුත්ව තිබුණ ද මෙම ප්‍රඥප්තියේ විධිවිධාන සළස්වා ඇති පරිදි එය බැහැර කරනු ලබන තෙක් දිගටම බේරුම් කළ හැකි විය යුතු ය. *ඔඩපන විකුණනු ලබන තෙක් දිගටම බේරුම් කළ හැකි බව.*

26. (1) යම් උකස්කරුවකු එම ඔඩපනයට අදාළ උකස් ලදු පතෙහි මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත භාර දී එම පත්‍රිකාව බඩු උකස්ගන්නා හෝ ඔහුගේ නියෝජිතයකු හෝ ඔහුගේ සේවකයකු ඉදිරියේ දී අත්සන් කරනු ලැබූ විට එම ඔඩපනය බේරුම්කර ගැනීම සඳහා ඔහුට හිමිකම් ලැබිය යුතු ය. *ඔඩපනයක් බේරුම්කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය.*

(2) උකස්කරු විසින් යථා පරිදි අත්සන් කරන ලද එම ඔඩපනයට අදාළ උකස් ලදුපතෙහි මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත භාර දී සහ බඩු උකස්ගන්නා හෝ ඔහුගේ නියෝජිතයකු හෝ ඔහුගේ සේවකයකු ඉදිරියේ දී එම පත්‍රිකාව යම් තැනැත්තකු විසින් අත්සන් කරනු ලැබූ විට උකස්කරුවකු නොවන එවැනි වෙනත් යම් තැනැත්තකුට යම් ඔඩපනයක් බේරුම්කිරීම සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(3) උකස්කරු මියයාම හෝ අබලතාවයකට පත්වීම හේතුවෙන් ඔඩපනයට අදාළ උකස් ලදුපතෙහි මුල් පත්‍රිකාව දරනු ලබන තැනැත්තා එම ඔඩපනය බේරුම්කර ගැනීම සඳහා හිමිකමක් ඇති බවට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන විට නමුත්, උකස්කරු විසින් යථා පරිදි පිටසන් කරන ලද සහ අත්සන් කරන ලද උකස් ලදුපතෙහි මුල් පත්‍රිකාව බඩු උකස්ගන්නා වෙත භාරදීමට නොහැකි වන විට එම උකස් ලදුපතෙහි මුල් පත්‍රිකාව දරනු ලබන තැනැත්තා එම ඔඩපනයට අදාළ එම උකස් ලදුපතෙහි එම මුල් පත්‍රිකාව සමඟ සාමදාන විනිශ්චයකාරවරයකු හෝ දිවුරුම් කොමසාරිස්වරයකු සහ ඔහු හඳුනනු ලබන යම් තැනැත්තකු ඉදිරියේ යථා පරිදි අත්සන් කරන ලද I වන උපලේඛනයේ දක්වා ඇති "ඉ" ආකෘතිය අනුව වූ ප්‍රකාශනයක් බඩු උගස්ගන්නා වෙත භාර දෙනු ලබන්නේ නම්, බඩු උකස්ගන්නා විසින් ඔහුට එම ඔඩපනය බේරුම් කිරීම සඳහා අවසර ලබාදිය යුතු ය.

(4) (1), (2) සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ණය මුදල සහ ඒ මත වන පොළිය ගෙවීම සහ එම ණය මුදල සම්බන්ධයෙන් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ඇත්නම්, එය ගෙවීම මත බඩු උකස්ගන්නා විසින් උකස්කරු වෙත හෝ එම ඔඩපනයට අදාළ උකස් ලදුපත දරන්නා වෙත එම ඔඩපනය භාර දිය යුතු අතර එම ඔඩපනය භාර දීම සම්බන්ධයෙන් බඩු උකස්ගන්නා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

එසේ වුව ද, බඩු උගස්ගන්නා හට එම උකස් ලදුපත දරන්නා විසින් එම උකස් ලදුපතේ මුල් පත්‍රිකාවේ සන්තකය නීති විරෝධී ලෙස ලබාගෙන ඇති බවට සැක කිරීමට හේතු පවතින විට බඩු උගස්ගන්නා විසින් වහාම එම තැනැත්තා සහ එම ලදුපත අල්ලා රඳවා තබාගත යුතු අතර වහාම පොලිස් නිලධරයකු හෝ ග්‍රාම නිලධරයකු වෙත ඔහු භාරදිය යුතු ය. එවිට එම පොලිස් නිලධරයා හෝ ග්‍රාම නිලධරයා විසින් වහාම එම තැනැත්තා හා ලදුපත මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

27. යම් ඔඩපනයක් බේරුම් කිරීම සඳහා හිමිකම් ලබන සහ ඉදිරිපත් වන යම් තැනැත්තකු විසින් ඒ සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් වෙත එම බඩු උකස්ගන්නාගේ පැහැර හැරීමක්, නොසැලකිල්ලක් හෝ හිතාමතා වැරදි සහගත ලෙස හැසිරීමක් හේතුවෙන් හෝ ඒ මඟින් එම ඔඩපනය උකස් කරන ලද අවස්ථාවේ දී එහි පැවති වටිනාකමට වඩා අඩු වටිනාකමකට පත්ව ඇති බවට හෝ පත්වීමට ඉඩ සළස්වා ඇති බවට එම අධිකරණය සෑහීමට පත්වන අයුරින් කරුණු ඉදිරිපත් කර ඇති විට, අධිකරණය විසින් සුදුසු යයි සිතනු ලබන්නේ නම් එම ඔඩපනයේ හිමිකරු සෑහීමට පත්වන ආකාරයේ සාධාරණ වන්දි මුදලක් ප්‍රදානය කළ යුතු අතර අධිකරණය විසින් නියම කරනු ලබන යම් ආකාරයකට බඩු උකස්ගන්නා විසින් ගෙවිය යුතු හෝ බඩු උකස්ගන්නා වෙත ගෙවිය යුතු මුදලෙන් එම වන්දි මුදල් ප්‍රමාණය අඩුකළ යුතු ය. *ඔඩපනයක් ක්ෂය වීම සඳහා වන්දි ගෙවීම.*

ලදුපතක් නොමැති හිමිකරුවන් සහ උකස්කරුවකු ආරක්ෂා කිරීම.

28. (1) උකස් ලදුපතේ මුල් පත්‍රිකාව නොමැතිව යම් ඔඩපනයක හිමිකරු බවට හිමිකම් පෑමක් ඉදිරිපත් කරනු ලබන යම් තැනැත්තකු හෝ උකස් ලදුපතේ මුල් පත්‍රිකාව දැරීම සඳහා හිමිකමක් ඇති බවට හිමිකම්පානු ලබන යම් තැනැත්තකු එම උකස් ලදුපතේ මුල් පත්‍රිකාව නැති වී ඇති බවට, සොරකම් කර ඇති බවට, අස්ථානගත වී ඇති බවට, විනාශ වී ඇති බවට හෝ වංචනිකව ඔහුගෙන් ලබාගෙන ඇති බවට චෝදනා කරනු ලබන්නේ නම් සාමදාන විනිශ්චයකාරවරයකු ඉදිරියේ සහ සාක්ෂිකරුවකු වශයෙන් ඔහු හඳුනනු ලබන යම් තැනැත්තකු ඉදිරියේ යථා පරිදි ලියා අත්සන් කරන ලද I වන උපලේඛනයේ "ඊ" ආකෘතිය අනුව වූ ප්‍රකාශනයක් බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර එවිට එම උකස් ලදුපතේ මුල් පත්‍රිකාව ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලෙස ඔහු සහ බඩු උකස්ගන්නා අතර සියලු සමාන අයිතිවාසිකම් හා ප්‍රතිකර්මවලට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

එසේ වුව ද, යම් ඔඩපනයක් බේරුම් කිරීමේ කාර්යය සඳහා 26 වන වගන්තියේ නියම කර ඇති පරිදි එහි උකස් ලදුපතේ මුල් පත්‍රිකාව නොව උකස් ලදුපතේ උප පත්‍රිකාව ඔහු විසින් අත්සන් කළ යුතු ය.

(2) එම ප්‍රකාශනය එහි ඇතුළත් වැදගත් තොරතුරු සම්බන්ධයෙන් වංචනික හෝ සාවද්‍ය වන බවට සත්‍ය වශයෙන් ම හෝ පටහැනි දැන්වීමක් ඔහු සතු වුවහොත් මිස එම ඔඩපනය භාරදීමෙන් හෝ අන්‍යාකාරයෙන් එම ප්‍රකාශයනට අනුකූලව ක්‍රියා කිරීමෙන් බඩු උකස්ගන්නා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබේ.

උකස් ලදුපත බඩු උකස්ගන්නා විසින් රඳවා ගත යුතු බව.

29. (1) යම් ඔඩපනයක් බේරුම් කිරීමේ කාර්යය සඳහා බඩු උකස්ගන්නා වෙත උකස් ලදුපතේ මුල් පත්‍රිකාව භාරදෙනු ලබන විට, බඩු උකස්ගන්නා විසින් එම උකස් ලදුපතේ මුල් පත්‍රිකාව සහ උකස් ලදුපතේ උපපත්‍රිකාව එම ඔඩපනය බේරුම් කරනු ලබන දිනයේ සිට ගණන් ගනු ලබන වර්ෂ දෙකක කාලසීමාවක් සඳහා ඔහුගේ සන්තකයේ රඳවා ගත යුතු ය.

(2) ඔඩපනයට අදාළ උකස් ලදුපතේ පත්‍රිකාව භාරදීමෙන් තොරව යම් ඔඩපනයක් බේරුම් කරනු ලබන විට බඩු උකස්ගන්නා විසින් එම ඔඩපනය බේරුම් කරනු ලබන දිනයේ සිට ගණන් ගනු ලබන වසර දෙකක කාලසීමාවක් සඳහා එම ඔඩපනයට අදාළ උකස් ලදුපතේ උපපත්‍රිකාව සහ එම බේරුම් කිරීමේ කාර්යය සඳහා 28 (1) වන වගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය ඔහුගේ සන්තකයේ රඳවා ගත යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් ඔඩපනයක් විකුණනු ලබන විට බඩු උකස්ගන්නා විසින් එම විකිණීමේ දිනයේ සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලසීමාවක් සඳහා එම ඔඩපනයට අදාළ උකස් ලදුපතේ උපපත්‍රිකාව ඔහුගේ සන්තකයේ රඳවා ගත යුතු ය.

බඩු උකස්ගන්නන් විසින් ලබාදෙන ලද ඇප තැන්පතු මුදල් ඉල්ලීම සහ ආපසු ලබාදීම.

30. (1) යම් අවස්ථාගත කරුණු යටතේ යම් ඔඩපනයක් බඩු උකස්ගන්නා වෙත උකස් කර ඇති අවස්ථාවේ දී නැති වුවහොත් උකස්කරුට හෝ එම ඔඩපනය බේරුම් කිරීම සඳහා හිමිකම් ලබන වෙනත් යම් තැනැත්තකුට එම ඔඩපනයේ වර්තමාන වෙළඳපළ වටිනාකම ගෙවිය යුතු ය. බඩු උකස්ගන්නා විසින් ඉදිරිපත් කර ඇති ඇප මුදල වන්දි මුදල් ගෙවීම සම්බන්ධයෙන් නියම කරනු ලැබ ඇති ආකාරයට අදාළ විය යුතු ය.

(2) බඩු උකස්ගන්නකු වශයෙන් ව්‍යාපාරය පවත්වාගෙන යාම යම් තැනැත්තකු විසින් අවසන් කරනු ලබන විට, ඔහු විසින් ඉදිරිපත් කර ඇති ඇපය (1) වන උපවගන්තියේ සඳහන් යම් වන්දි මුදලක් ගෙවීම සඳහා අදාළ කර ගැනීම පිණිස අඩු කිරීමෙන් පසු ඔහු වෙත ආපසු ලබාදිය යුතු ය.

ගින්නක්, ස්වභාවික ආපදාවක් හෝ වෙනත් යම් සිදුවීමක දී බඩු උකස්ගන්නාගේ වගකීම.

31. (1) යම් ඔඩපනයක් ගින්නක්, ස්වභාවික ආපදාවක් හෝ වෙනත් යම් සිදුවීමක් හේතුවෙන් විනාශ වූ විට හෝ හානියට පත් වූ විට සහ ඒ සම්බන්ධව ඉල්ලීමක් කර ඇති විට බඩු උකස්ගන්නා විසින් ණය මුදල හා පොලිය සහ එම ණය මුදල සම්බන්ධයෙන් ගෙවිය යුතු ව්‍යාපාර පිරිවැටුම් බද්දක් ඇත්නම් එම බදු මුදල අඩුකිරීමෙන් පසු බේරුම් කරනු ලබන කාලසීමාව තුළ දී එම ඔඩපනයේ වටිනාකම ගෙවීම සඳහා වගකීමට යටත් විය යුතු ය.

(2) සෑම බඩු උකස්ගන්නකු විසින්ම ඔහු වෙත උකස් කර ඇති භාණ්ඩවල මුළු වටිනාකම සඳහා ඔහුගේ ව්‍යාපාරය රක්ෂණය කළ යුතු ය.

(3) සෑම බඩු උකස්ගන්නකු විසින්ම උකස් කරන ලද භාණ්ඩ ආරක්ෂා සහිත ආකාරයෙන් ගබඩාකර තබා ගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ වගකීමට බැඳී සිටිය යුතු ය.

32. සෑම බඩු උකස්ගන්නකු විසින්ම ඔඩපනය බේරුම් කරනු ලබන අවස්ථාවේ දී ණය මුදල සහ ඔහු වෙත ගෙවනු ලබන පොළිය සහ ඔහු විසින් අයකර ගන්නා ලද යම් බදු මුදල් ඇත්නම් එම බදු මුදල් සඳහා ලදුපතක් නිකුත් කළ යුතු අතර එම ලදුපතේ පිටපතක් ඔඩපන පිළිබඳ පොත සමඟ ආරක්ෂා සහිතව තබාගත යුතු ය. එම ලදුපත මෙම ප්‍රඥප්තියේ I වන උපලේඛනයේ දක්වා ඇති "උ" ආකෘතියට අනුකූල විය යුතු ය. බඩු උකස්ගන්නාගේ ලදුපත.

33. (1) බේරුම් කිරීමේ කාලසීමාව තුළ දී බේරුම්කර නොමැති සෑම ඔඩපනයක් ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මගින් බැහැර කළ යුතු නමුත් අන්‍යාකාරයෙන් බැහැර නොකළ යුතු අතර විකිණීම සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ III වන උපලේඛනයේ නියෝග පිළිපැදිය යුතු ය. ඔඩපන වෙන්දේසි කිරීමෙන් විකිණිය යුතු බව.

(2) මෙම වගන්තියේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් යම් ඔඩපනයක් විකුණනු ලැබිය යුතු වන විට, එම ඔඩපනය උකස් කරනු ලැබ ඇත්තේ යම් බඩු උකස්ගන්නකු වෙත ද එම බඩු උගස්ගන්නා විසින් එම විකිණීම සිදු කිරීම සඳහා නියම කර ඇති දිනය හා වේලාව සහ එම විකිණීම සිදු කරනු ලබන ස්ථානය පිළිබඳව පළාත් කොමසාරිස්වරයා වෙත අවම වශයෙන් දින හැටකට පෙර ලිඛිත දැන්වීමක් කළ යුතු ය. පළාත් කොමසාරිස්වරයා විසින් ඔහුගේ තීරණය බඩු උකස්ගන්නා වෙත එම විකිණීමට දින විසි එකකට පෙර දැනුම් දිය යුතු ය.

(3) යම් බඩු උගස්ගන්නකුගේ යම් ඔඩපනයක් මෙම ප්‍රඥප්තිය යටතේ විකුණනු ලැබිය යුතු වන විට, එම ඔඩපනය විකිණීමට දින දාහතරකට පෙර ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන දැන්වීමක් මගින් එම විකිණීම සිදු කරනු ලබන දිනය, වේලාව සහ ස්ථානය උකස්කරු වෙත දැනුම් දිය යුතු ය.

34. (1) ණය මුදල සහ විකුණනු ලබන දිනයට ඒ මත අයවිය යුතු පොළිය සහ එම ණය මුදල සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු මුදල් වලට වඩා වැඩි යම් මුදලකට මෙම ප්‍රඥප්තිය යටතේ යම් ඔඩපනයක් විකුණනු ලබන සෑම අවස්ථාවක දී ම බඩු උකස්ගන්නා විසින් ණය මුදල සහ පොළිය සහ ව්‍යාපාර පිරිවැටුම් බද්දට වඩා වැඩි මුදලකට ඔඩපනය විකුණනු ලබන විට කාර්ය පටිපාටිය.

*(අ)* එම ඔඩපනය විකුණනු ලබන මුදල සහ එම විකිණීමේ දී දරනු ලබන අවශ්‍ය වියදම් හා ගාස්තු අඩු කිරීමෙන් පසු උකස්කරුගේ බැරට පවතින යම් මුදලක් පිළිබඳව එම ඔඩපනයේ උකස්කරු වෙත වහාම දැනුම් දිය යුතු ය.

*(ආ)* එම විකිණීමේ දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබූ විට එම ඔඩපනයට අදාළ උකස් ලදුපතෙහි මුල් පත්‍රිකාව දරන්නාට උකස්කරුගේ බැරට පවතින මුදල ගෙවනු ලැබිය යුතු ය; සහ

*(ඇ)* එම විකිණීමේ දිනයේ සිට එක් අවුරුද්දක කාලසීමාව ඇතුළත එවැනි ඉල්ලීමක් කරනු නොලැබූ විට එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව උකස්කරුගේ බැරට පවතින යම් මුදලක් වහාම පළාත් කොමසාරිස්වරයා වෙත පැවරිය යුතු ය.

(2) පළාත් කොමසාරිස්වරයා වෙත මුදල් පවරනු ලැබූ වහාම ඒ පිළිබඳව උකස්කරු වෙත දැනුම් දිය යුතු ය.

(3) විකිණීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත උකස්කරු විසින් පළාත් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පළාත් කොමසාරිස්වරයා විසින් දින තිහක කාලසීමාවක් ඇතුළත එම මුදල උකස් ලදුපතේ මුල් පත්‍රිකාව දරන්නා වෙත ගෙවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ අවුරුදු දෙකක කාලසීමාව ඇතුළත එවැනි ඉල්ලීමක් කරනු නොලැබූ විට එම මුදල උතුරු පළාත් සභාවේ අරමුදලට බැර කළ යුතු ය.

(5) විකිණීමේ දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එවැනි කිසිදු ඉල්ලීමක් භාර නොගත යුතු ය.

35. බඩු උකස්ගන්නා විසින් ඔහු වෙත උකස් තබන ලද යම් ඔඩපනයක් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පවත්වනු ලබන හෝ පැවැත්වීමට අදහස් කරනු ලබන වෙන්දේසියක් මගින් විකිණීමේ දී ඒ සඳහා ලන්සු ඉදිරිපත් කිරීම හා ඒවා මිල දී ගැනීම ඔහු විසින් සිදුකළ හැකි අතර එසේ මිලදී ගැනීමේ දී එම මිල දී ගන්නා ලද ඔඩපනයේ පරම හිමිකරු ඔහු වන බවට සළකනු ලැබිය යුතු ය. බඩු උකස්ගන්නා විසින් ඔඩපන මිල දී ගැනීම.

## IV වන කොටස

### පරීක්ෂා කිරීම, සෝදිසි කිරීම හා තහනමට ගැනීම

ව්‍යාපාරය පරීක්ෂා කිරීම.

36. පළාත් කොමසාරිස්වරයා හෝ පළාත් නියෝජ්‍ය කොමසාරිස්වරයා හෝ පළාත් කොමසාරිස්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් තක්සේරුකරුවකුට බඩු උකස් ගන්නකුගේ ව්‍යාපාරයේ ගිණුම් පරීක්ෂා කිරීම සඳහා අධිකාරිය තිබිය යුතු යි.

විකුණුම් පොත පරීක්ෂා කිරීමේ බලය.

37. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ යම් ඔඩපනයක් විකුණනු ලබන දිනයේ සිට අවුරුදු දෙකක කාලසීමාවක් ඇතුළත යම් ඕනෑම අවස්ථාවක දී, උකස් ලදුපතේ මුල් පත්‍රිකාව දරන්නා විසින් බඩු උකස්ගන්නාගේ පොතේ සඳහන් වන හෝ වෙන්දේසිකරුවකු විසින් සහතික කරන ලද වෙන්දේසියේ විකිණීම පිළිබඳ තොරතුරු ඇතුළත් නාමාවලියේ සඳහන් විකිණීම පිළිබඳ සටහන් පරීක්ෂා කරනු ලැබිය හැකි ය. බඩු උකස්ගන්නා විසින් උකස් ලදුපතේ මුල් පත්‍රිකාව දරන්නාට එම පොතෙහි හෝ නාමාවලියේ ඇතුළත් විකිණීම පිළිබඳ සටහන් පරීක්ෂා කිරීමට අවසර ලබාදිය යුතු ය.

උකස් කිරීම සඳහා භාණ්ඩ ඉදිරිපත් කරනු ලබන තැනැත්තන්ට එම භාණ්ඩ සම්බන්ධයෙන් නිසි හේතු දැක්වීමක් සිදුකළ නොහැකි වන්නා වූ විට කාර්ය පටිපාටිය

38. යම් තැනැත්තකු විසින් -

*(අ)* බඩු උකස්ගන්නකු වෙත යම් භාණ්ඩයක් උකස් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විට, තමාගේ ජාතික හැඳුනුම්පත, ගුවන් ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන විට හෝ නොහැකි වන්නා වූ විට;

*(ආ)* බඩු උකස්ගන්නකු වෙත යම් භාණ්ඩයක් උකස් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විට, ඒවායේ සන්තකය ඔහු ලබාගත් ආකාරය පිළිබඳව සෑහීමට පත්විය හැකි හේතු දැක්වීමක් ඉදිරිපත් කළ නොහැකි වන්නා වූ විට;

*(ඇ)* එම තැනැත්තා විසින් බඩු උකස්ගන්නා වෙත උකස් තබා ඇති යම් භාණ්ඩයක් ඔහුගේ දේපළක් වන්නේ ද හෝ එසේ නොවන්නේ ද හෝ ඔහුගේ නම සහ ලිපිනය සම්බන්ධයෙන් හෝ භාණ්ඩයේ හිමිකරුගේ නම සහ ලිපිනය සම්බන්ධයෙන් හිතාමතාම සාවද්‍ය තොරතුරු ලබාදෙනු ලබන විට;

*(ඈ)* බේරාගැනීම සඳහා හිමිකම් නොලබන යම් ඔඩපනයක් බේරාගැනීමට කවර හෝ තැනැත්තෙකු තැත් කරනු ලබන විට සහ ප්‍රයත්න දරනු ලබන විට; සහ

*(ඉ)* උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් බඩු උකස්ගන්නා වෙත ඉදිරිපත් කරනු ලැබීමේ දී එම භාණ්ඩය සොරකම් කරන ලද හෝ අන්‍යාකාරයෙන් නීතිවිරෝධී ලෙස ලබාගත් භාණ්ඩ බවට සැක කිරීමට බඩු උකස්ගන්නා වෙත හේතු පවතින්නා වූ විට; බඩු උකස්ගන්නා විසින් එම තැනැත්තා සහ භාණ්ඩය අල්ලා රඳවා ගත හැකි අතර, ඒවා හැකිතාක් ඉක්මණින් පොලිස් නිලධරයකු හෝ ග්‍රාම නිලධරයකුගේ භාරයට පත් කළ යුතු අතර, එම පොලිස් නිලධරයා හෝ ග්‍රාම නිලධරයා විසින් එම තැනැත්තා සහ භාණ්ඩය වහාම මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කළ යුතු ය.

බඩු උකස්ගන්නාගේ සාප්පුව හෝ නිවාසය පරීක්ෂා කිරීමට ඇති බලය.

39. (1) පළාත් කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද යම් නිලධරයන් කණ්ඩායමක් විසින් හෝ දිවා කාලයේ ඕනෑම වේලාවක දී බඩු උකස්ගන්නාගේ සාප්පුවට හෝ ව්‍යාපාරික ස්ථානයට හෝ නිවාසයට ඇතුළුවී එම බඩු උකස්ගන්නා විසින් පවත්වාගෙන යනු ලබන යම් පොත් හා ලේඛන හෝ බඩු උකස්ගන්නා වෙත උකස් තබා ඇති යම් භාණ්ඩ ඔඩපනයක් පිළිබඳ අවශ්‍ය සටහන් ලබා ගැනීම හා සෝදිසි කිරීම නීත්‍යානුකූල විය යුතු ය. පොලීසියේ සහාය අවශ්‍ය වන බව පළාත් කොමසාරිස්වරයාගේ මතය වන විට පොලිස් නිලධරයකුට එසේ බලය පවරන ලද නිලධරයා හෝ නිලධරයන් සමඟ එහි යා හැකි ය.

(2) කිසිදු තැනැත්තකු විසින් එම කාර්ය ඉටු කරනු ලබන යම් නිලධරයකුට හෝ නිලධරයන් කණ්ඩායමකට කිසිදු බාධාකිරීමක් නොකළ යුතු ය.

## V වන කොටස

### වැරදි සහ දණ්ඩන

උකස්කරුවන් සහ අනෙකුත් තැනැත්තන් විසින් සිදු කරනු ලබන වැරදි.

40. *(අ)* බඩු උකස්ගන්නකු වෙත යම් භාණ්ඩයක් උකස් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විට එම භාණ්ඩය ඔහුගේ සන්තකයට පත් වූ ආකාරය පිළිබඳව සෑහීමකට පත් විය හැකි හේතු දැක්වීමක් ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන හෝ නොහැකි වන්නා වූ;

(ආ) යම් තැනැත්තකු විසින් බඩු උකස්ගන්නා වෙත උකස් තබා ඇති යම් භාණ්ඩයක් ඔහුගේ දේපළක් වන්නේ ද හෝ එසේ නොවන්නේ ද යන්න පිළිබඳව හෝ ඔහුගේ නම සහ ලිපිනය සම්බන්ධයෙන් හෝ භාණ්ඩයේ හිමිකරුගේ නම සහ ලිපිනය සම්බන්ධයෙන් හිතාමතාම සාවද්‍ය තොරතුරු ලබාදෙනු ලබන;

(ඇ) නීත්‍යානුකූල නිදහසට කරුණු දැක්වීමක් නොමැතිව වෙනත් තැනැත්තකුගේ භාණ්ඩයක් වන යම් දෙයක් බඩු උකස්ගන්නා වෙත උකස් තබනු ලබන;

(ඈ) යම් ඔඩපනයක් බේරාගැනීම සඳහා හිමිකමක් නොමැති යම් තැනැත්තකු විසින් යම් ඔඩපනයක් බේරාගැනීම සඳහා උත්සාහ කරනු ලබන විට හෝ වෑයම් කරනු ලබන විට;

(ඉ) යම් වැදගත් තොරතුරු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශනයක් වන බවට දනිමින්ම ඔහු සඳහා හෝ වෙනත් තැනැත්තකු හඳුනා ගනු ලබන ලෙස මෙම ප්‍රඥප්තිය යටතේ යම් ප්‍රකාශනයක් ඉදිරිපත් කරනු ලබන; හෝ

(ඊ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන හෝ මෙම ප්‍රඥප්තිය මගින් ඔහු වෙත නියම කර ඇති යම් ක්‍රියාවක් සිදු කිරීම පැහැර හරිනු ලබන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය

41. (අ) වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු බවට පෙනී යන යම් තැනැත්තකුගෙන් හෝ මත්පැන් පානය කර සිටින බවට පෙනී යන යම් තැනැත්තකුගෙන් උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් භාර ගනු ලබන; බඩු උකස් ගන්නන් විසින් සිදු කරනු ලබන වැරදි.

(ආ) උකස් ලදුපතේ මුල් පත්‍රිකාව ලබා නොදී යම් භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාරගනු ලබන;

(ඇ) වෙනත් බඩු උකස්ගන්නකු විසින් නිකුත් කර ඇති උකස් ලදුපතේ මුල් පත්‍රිකාව මිල දී ගනු ලබන හෝ උකස් කිරීමේ දී ගනු ලබන හෝ හුවමාරු කරගනු ලබන;

(ඈ) උකස් කිරීම සඳහා වන යම් භාණ්ඩයක් භාර ගැනීම සඳහා වයස අවුරුදු දහඅටට අඩු යම් සේවකයකු සේවයේ යොදවනු ලබන;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක දී හැර ඔහු වෙත උකස් තබා ඇති අවස්ථාවේ දී යම් ඔඩපනයක් මිල දී ගනු ලබන;

(ඊ) මිල දී ගැනීමේ අදහසින් යුතුව ඔහු වෙත උකස් තබා ඇති යම් ඔඩපනයක් බේරාගැනීම සඳහා ඉදිරිපත් වන්නා වූ;

(උ) යම් භාණ්ඩයක් උකස් කරනු ලබන හෝ උකස් කිරීම සඳහා ඉදිරිපත්වන යම් තැනැත්තකු සමග බේරාගැනීමේ කාලසීමාව තුළ දී එම භාණ්ඩය මිල දී ගැනීම, විකිණීම හෝ බැහැර කිරීම සඳහා එකඟ වන්නා වූ;

(ඌ) මෙම ප්‍රඥප්තිය මගින් බලය පවරා ඇති යම් ආකාරයකට හා යම් අවස්ථාවක දී හැර ඔහු වෙත උකස් තබන ලද යම් ඔඩපනයක් විකුණනු ලබන හෝ අන්‍යාකාරයෙන් බැහැර කරනු ලබන;

(එ) මෙම ප්‍රඥප්තිය යටතේ ඔහු විසින් තබාගත යුතු බවට නියම කර ඇති යම් පොතක යම් සාවද්‍ය සටහනක් ඇතුළත් කරනු ලබන හෝ මෙම ප්‍රඥප්තිය මගින් එහි ඇතුළත් කළ යුතු බවට ඔහු වෙත නියම කර ඇති යම් සටහනක් එහි ඇතුළත් කිරීම පැහැර හරිනු ලබන;

(ඒ) කිසිදු සාධාරණ හෝ යුක්ති සහගත හේතුවක් නොමැතිව මෙම ප්‍රඥප්තියේ 26 වන වගන්තිය හා 37 වන වගන්ති යටතේ යම් තැනැත්තකු අල්ලාගනු ලබන හෝ රඳවා ගනු ලබන;

(ඔ) ඔහු වෙත උකස් තබන ලද සියලුම භාණ්ඩවල මුළු වටිනාකම සඳහා ඔහුගේ ව්‍යාපාරය රක්ෂණය කිරීම පැහැර හරිනු ලබන;

(ඕ) මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන උල්ලංඝනය කරනු ලබන හෝ මෙම ප්‍රඥප්තිය මගින් ඔහු වෙත නියම කර ඇති යම් ක්‍රියාවක් සිදුකිරීම පැහැර හරිනු ලබන;

(ක) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පළාත් කොමසාරිස්වරයා වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම පැහැර හරිනු ලබන,

සෑම බඩු උකස්කරුවෙකුම වරදකට වරදකරු විය යුතු ය.

ලිනන් රෙදි, නොතිමි භාණ්ඩ යනාදිය උකස් වශයෙන් ලබාගැනීම.

42\. (1) යම් තැනැත්තකු වෙත සේදීම, පිරිසිදු කිරීම, ඉස්තිරික්ක කිරීම, අඩුපාඩු සැකසීම, නිෂ්පාදනය කිරීම, සකස් කිරීම, නිමකිරීම හෝ අලංකරණය කිරීම සඳහා භාරදෙනු ලැබ ඇති යම් ලිනන් රෙදි හෝ ඇඟළුම් හෝ නොතිමි භාණ්ඩ හෝ ද්‍රව්‍ය බව දැන දැනම ඒවා උකස් කිරීම සඳහා භාරගනු ලබන සෑම බඩු උකස්ගන්නකු ම වරදකට වරදකරු විය යුතු ය.

(2) මෙම වගන්තිය යටතේ වන යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් යම් බඩු උකස්ගන්නකු වරදකරු කළ අවස්ථාවක, එම වරද සඳහා එකී අධිකරණය විසින් පැනවිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, අධිකරණය විසින් අධිකරණය ඉදිරියේ හෝ අධිකරණය විසින් විධාන කරනු ලබන වෙනත් යම් ආකාරයකට ඔඩපනයේ හිමිකරුට එම ඔඩපනය නැවත භාරදෙන ලෙස බඩු උකස්ගන්නා වෙත ආඥාවක් කරනු ලැබිය හැකි ය.

බඩු උකස්ගන්නන් විසින් සිදු කරනු ලබන වැරදි.

43\. 34 වන වගන්තිය මගින් නියම කරනු ලබන පරිදි බඩු උකස්කරුගේ නමින් පළාත් කොමසාරිස්වරයා වෙත තැන්පත් කළ යුතු මුදල තැන්පත් කිරීම පැහැර හරිනු ලබන සෑම බඩු උකස්ගන්නකු ම වරදකට වරදකරු වන අතර එවැනි වරදක් සඳහා යම් අධිකරණයක් විසින් යම් බඩු උකස්ගන්නක, වරදකරුවකු කරනු ලැබූ විට, එම වරද සඳහා එම අධිකරණය විසින් පැනවිය හැකි වෙනත් යම් දඬුවමකට අමතරව, අධිකරණය විසින් පනවන ලද දඩයක් වශයෙන් එකී මුදලට සමාන මුදලක් බඩු උකස්ගන්නා වෙතින් අයකර ගැනීම සඳහා අධිකරණය විසින් ආඥාවක් ලබාදිය හැකි ය. අධිකරණය විසින් එවැනි සෑම මුදලක් ම අයකර ගනු ලැබූවිට එම මුදල උතුරු පළාත් සභා අරමුදලේ තැන්පත් කළ යුතු ය.

බඩු උකස්ගන්නාගේ සේවකයා හෝ නියෝජිතයා විසින් සිදු කරන වැරදි.

44\. බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරික කටයුතු අතරතුර දී හෝ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් බඩු උකස්ගන්නාගේ සේවකයා හෝ නියෝජිතයා විසින් සිදු කරන ලද යම් දෙයක් හෝ පැහැර හැරීමක්, අවස්ථාවෝචිත පරිදි බඩු උකස්ගන්නා විසින් සිදුකළ හෝ පැහැර හැර ඇති දෙයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

එසේ වුව ද, බඩු උකස්ගන්නා සාප්පුවේ හෝ ව්‍යාපාරික ස්ථානයේ නොමැති අවස්ථාවක, මෙම ප්‍රඥප්තියේ යම් විධිවිධාන උල්ලංඝනය වන අයුරින් බඩු උකස්ගන්නාගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු විසින් යම් දෙයක් සිදු කරන ලද විට හෝ නොකර හරින ලද විට එම සේවකයා හෝ නියෝජිතයා වරදකට වරදකරු වන්නේ ය.

දණ්ඩනය.

45\. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම රුපියල් ලක්ෂ දෙකක් නොඉක්මවනු ලබන දඩයකට හෝ මාස හයක් නොඉක්මවනු ලබන කාලයක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) මෙම උපවගන්තිය යටතේ අධිකරණයක් විසින් අයකරනු ලබන සහ රැස්කරනු ලබන දඩමුදල උතුරු පළාත් සභා අරමුදල වෙත බැර කළ යුතු ය.

බඩු උකස්ගන්නකු විසින් භාණ්ඩ නීති විරෝධී ලෙස සන්තකයේ තබා ගැනීම.

46\. මෙම ප්‍රඥප්තිය යටතේ පවරන ලද යම් නීති කෘත්‍යයක දී බඩු උකස්ගන්නා විසින් යම් භාණ්ඩයක් නීති විරෝධී ලෙස සන්තකයේ තබාගෙන ඇති බවට අධිකරණය වෙත වාර්තා වූ විට, අධිකරණය විසින් සුදුසු යයි සිතන පරිදි යම් නියමයන් යටතේ එකී භාණ්ඩය ඉදිරිපත් කරන ලෙසත්, එකී අධිකරණය විසින් නම් කරන ලද තැනැත්තකුට ඒවා භාරදෙන ලෙසත් ආඥාවක් කිරීමට එකී අධිකරණයට නිසි බලය පැවතිය යුතු ය.

## VI වන කොටස
## පොදු විධිවිධාන

නම් කිරීම.

47\. (1) බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය යම් පුද්ගලයකු විසින් සිදු කරගෙන යන අවස්ථාවක, ඔහුගේ මරණය සිදු වීමෙන් පසුව, 4 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සිදු කිරීමෙන් අනතුරුව මෙම ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ නම් කර ඇති තැනැත්තා වෙත ව්‍යාපාරය පැවරිය යුතු ය.

(2) බඩු උකස්ගන්නාට පෙර නම් කළ තැනැත්තකු මියගිය අවස්ථාවක සහ එකී බඩු උගස්ගන්නා විසින් කිසිදු තැනැත්තකු නම් කර නොමැති අවස්ථාවක, එකී බඩු උකස්ගන්නා මිය යාමෙන් අනතුරුව එකී බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීම සඳහා, පළාත් කොමසාරිස්වරයා විසින් යම් තැනැත්තකු පත්කළ යුතු ය.

(3) *(අ)* යම් අශක්නුතාවක් හෝ වෙනත් යම් හේතුවක් මත බඩු උකස්ගන්නාට ඔහුගේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යා නොහැකි අවස්ථාවක, බඩු උකස්ගන්නාට ඔහු වෙනුවට යම් තැනැත්තකු නම් කළ හැකි ය. මෙම ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව එකී නම් කිරීම සිදු කළ යුතු ය.

*(ආ)* පළාත් කොමසාරිස්වරයා විසින් එකී තැනැත්තා ලියාපදිංචි කළ හැකි අතර ව්‍යාපාරය එකී නම් කළ තැනැත්තා වෙත පැවරිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය යටතේ බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පවරනු ලැබූ අවස්ථාවක, පළාත් කොමසාරිස්වරයා සෑහීමට පත්වීමෙන් පසුව වත්කම් සහ බැරකම් පවරා ඇති තැනැත්තා වෙත බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

(5) බඩු උකස් ගන්නාගේ ව්‍යාපාරය හවුල් ව්‍යාපාරයක් වශයෙන් පවත්වාගෙන යා යුතු අවස්ථාවක, එම ව්‍යාපාරය ඇවර කිරීමේ දී බඩු උකස් කරන්නන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන යම් විධිවිධානවලින් හවුල් ව්‍යාපාර ගිවිසුම සමන්විත විය යුතු ය.

48. (1) යම් බඩු උකස්ගන්නකු විසින් ඔහුගේ බඩු උකස්ගැනීමේ ව්‍යාපාරය පැවරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එකී බඩු උකස්ගන්නා විසින් - බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය පැවරීම.

*(අ)* ඔහුට විරුද්ධව පැමිණිලි නොමැති බව සනාථ කිරීම සඳහා ව්‍යාපාරික ස්ථානය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගෙන් සහ බඩු උකස්ගන්නා පදිංචිව සිටින ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙතින් ලබාගත් සහතික;

*(ආ)* පැවරුම්ලාභියාට එරෙහිව පැමිණිලි නොමැති බව සනාථ කිරීම සඳහා එකී ව්‍යාපාරය පවරාදීමට අදහස් කරනු ලබන තැනැත්තා (මෙහි මින්මතු පැවරුම් ලාභියා යනුවෙන් සඳහන් කරනු ලබන) පදිංචි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙතින් ලබාගත් සහතිකයක්;

*(ඇ)* බඩු උකස්ගන්නා සහ පැවරුම්ලාභියාට එරෙහිව අධිකරණයන්හි අපරාධ නඩු කටයුතු නොපවතින බව සනාථ කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක්; සහ

*(ඈ)* බේරාගැනීමට නියමිත සියලුම ඔඩපන සම්බන්ධ සියලුම තොරතුරු සහ අවශ්‍ය අනෙකුත් යම් තොරතුරු, සහිතව පළාත් කොමසාරිස්වරයා වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම සිදුකර ඇති බඩු උකස්ගන්නා විසින් එකී ඉල්ලීම සිදු කළ දින සිට කිසිදු භාණ්ඩයක් භාර නොගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීම සිදු කිරීමෙන් අනතුරුව එකී බඩු උකස් ගන්නා විසින් සතියක කාලසීමාවක් ඇතුළත පැවරුම්ලාභියාගේ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් දැන්වීමක් දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් දිනපතා පුවත්පතක පළකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කර ඇති දැන්වීම, ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවිය යුතු ය.

(5) පළාත් කොමසාරිස්වරයා විසින් සෑහීමට පත්වීමෙන් පසුව පැවරුම්ලාභියා වෙත බලපත්‍රයක් නිකුත් කළ යුතු ය.

49. යම් බඩු උකස්ගන්නකු, තම බඩු උකස් ගැනීමේ ව්‍යාපාරය ඇවර කිරීමට අපේක්ෂා කරනු ලබන අවස්ථාවක, එකී බඩු උකස් ගන්නා විසින් - බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීම.

*(අ)* ඔහුට විරුද්ධව පැමිණිලි නොමැති බව සනාථ කිරීම සඳහා ව්‍යාපාරික ස්ථානය පිහිටි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙතින් සහ බඩු උකස් ගන්නා පදිංචිව සිටින ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා වෙතින් ලබාගත් සහතික;

*(ආ)* බඩු උකස් ගන්නාට එරෙහිව අධිකරණයේ අපරාධ නඩු කටයුතු කිසිවක් නොමැති බව සනාථ කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්; සහ

*(ඇ)* බේරා ගැනීමට නියමිත සියලුම ඔඩපන පිළිබඳ තොරතුරු සහ අවශ්‍ය වන්නා වූ වෙනත් යම් තොරතුරු, සහිතව පළාත් කොමසාරිස්වරයා වෙත ඔහුගේ එම අපේක්ෂාව පිළිබඳව දන්වා සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති බඩු උකස් ගන්නකු විසින්, එකී දින සිට කිසිදු භාණ්ඩයක් උකස් කිරීම සඳහා භාර නොගත යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් ලබා දීමෙන් අනතුරුව, එකී බඩු උකස් ගන්නා විසින් සතියක කාල සීමාවක් ඇතුළතම නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය සහ බඩු උකස් ගන්නාගේ බලපත්‍ර අංකය සහ බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය ඇවර කිරීමේ අපේක්ෂාව සඳහන් දැන්වීම, දිනපතා පුවත්පතක දෙමළ සිංහල සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකළ යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් දැන්වීම ව්‍යාපාරික ස්ථානයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවිය යුතු ය.

(5) පළාත් කොමසාරිස්වරයා විසින් එකී ඇවර කිරීම අධීක්ෂණය කළ යුතු නිලධරයා නම් කළ යුතු ය.

ගෙවීම් පැහැර හැරීම.

50. මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් ප්‍රකාර යම් බඩු උකස්ගන්නකු විසින් නිශ්චිත කාල පරිච්ඡේදයක් ඇතුළත ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතු මුදල ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එකී මුදල, මෙම ප්‍රඥප්තිය යටතේ බඩු උකස්ගන්නා විසින් ගෙවිය යුතු ගෙවීම් පැහැර හැරීමක් වශයෙන් සැලකිය යුතු ය.

බඩු උකස්ගන්නා ගෙවීම් පැහැර හැර ඇති බව දැන්වීම.

51. (1) බඩු උකස් ගන්නකු විසින් මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට ගෙවීම් පැහැර හැර ඇති යම් මුදල් අයකර ගැනීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීමට පෙරාතුව පළාත් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ සඳහන් කර ඇති "ආ, ආකෘතියේ දක්වා ඇති අවශ්‍ය විස්තර ද සමග මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ සඳහන් කර ඇති "අ, ආකෘතියේ දැක්වෙන දැන්වීම නිකුත් කළ යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇති බඩු උකස්ගන්නකුට (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ දැන්වීමෙන් දින දාහතරක් ඇතුළත, එකී මුදල ගෙවීම සම්බන්ධව විරෝධතා ඉදිරිපත් කළ හැකි අතර, පළාත් කොමසාරිස්වරයා විසින් එකී විරෝධතා සලකා බලා ඒ පිළිබඳ ඔහුගේ තීරණය ලබාදිය යුතු අතර එම තීරණය අවසානාත්මක විය යුතු වන්නේ ය. එසේ වුව ද, අසනීප වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් සාධාරණ හේතුවක් මත (1) වන උපවගන්තිය යටතේ නියෝගය නිකුත් කිරීමෙන් දින දහහතරක් ඇතුළත ගෙවීම පැහැර හරින්නා විරෝධතා ඉදිරිපත් කිරීමෙන් වැලකී සිටි බවට පළාත් කොමසාරිස්වරයා සෑහීමට පත් වේ නම්, එකී විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඔහුට කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කළ යුතු ය.

(3) *(අ)* (2) වන උපවගන්තිය යටතේ දැන්වීම හෝ අවසන් තීරණය ලැබීමෙන් පසු දින දාහතරක් ඉක්මවීම මත, මෙම ප්‍රඥප්තිය යටතේ බඩු උකස්ගන්නා විසින් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම බඩ උගස්ගන්නා විසින් පැහැර හැර ඇති අවස්ථාවක, පළාත් කොමසාරිස්වරයා විසින් මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ සඳහන් කර ඇති "ඇ" ආකෘතියේ දැක්වෙන සහතිකය සමග බඩු උකස්ගන්නා වෙත භාරදෙන ලද දැන්වීමේ සහතික කළ පිටපතක් සහ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ විස්තරවල සහතික කළ පිටපතක්, ගෙවීම පැහැර හැර ඇති බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරික ස්ථානය හෝ බඩු උකස්ගන්නා පදිංචි අධිකරණ බල ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්වරයා වෙත නිකුත් කළ යුතු ය.

*(ආ)* මහෙස්ත්‍රාත්වරයා විසින් ඉන් පසුව මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු මුදල් අයකර ගැනීම සඳහා ඔහුට එරෙහිව වැඩිදුර ක්‍රියාමාර්ග නොගත යුත්තේ මන්ද යන්න පිළිබඳව හේතු දැක්වීම පිණිස එකී බඩු උකස්ගන්නා අධිකරණය ඉදිරියට කැඳවිය යුතු අතර ප්‍රමාණවත් හේතු දැක්වීමක් සිදු නොකිරීම මත එකී මුදල එම බඩු උකස්ගන්නා මත බන්ධනාගාර ගත කිරීමක් සහිතව දඬුවම් කළ හැකි වරදක් සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් පනවනු ලබන දණ්ඩන නියමයක් මගින් පනවන ලද දඩ මුදලක් වශයෙන් සැලකිය යුතු ය. තව ද එවැනි වරදක් සඳහා පනවන ලද දඩය ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වන 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ විධිවිධාන (එකී වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ඇ) සහ (ඌ) ඡේද හැර) අදාළ කරගත යුතු අතර එකී දණ්ඩන නියමය පනවන ලද අවස්ථාවේ දී එකී උපවගන්තියේ විධිවිධාන යටතේ පැනවිය හැකිව තිබූ යම් විධානයක් කිරීමට මහෙස්ත්‍රාත්වරයාට හැකි ය.

(4) (අ) මෙම ප්‍රඥප්තිය යටතේ බඩු උකස් ගන්නා විසින් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම ඔහු විසින් පැහැර හැර ඇති අවස්ථාවක දී සහ මෙම වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ගෙවීම පැහැර හැර ඇති මුදල අයකර ගැනීම ප්‍රායෝගික නොවන බව පළාත් කොමසාරිස්වරයාගේ මතය වේ නම් හෝ ගෙවිය යුතු මුළු මුදල අයකර ගෙන නොමැති නම් එවිට මෙම ප්‍රඥප්තියේ IV වන උපලේඛනයේ සඳහන් කර ඇති "ඇ" ආකෘතියේ දැක්වෙන සහතිකය සමග බඩු උකස් ගන්නා වෙත භාරදෙන ලද දැන්වීමේ සහතික කළ පිටපතක් සහ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කළ විස්තරවල සහතික කළ පිටපතක්, ගෙවීම පැහැර හැර ඇති බඩු උගස්ගන්නා පදිංචි දිස්ත්‍රික්කයේ

හෝ එකී බඩු උගස්ගන්නාගේ යම් චංචල හෝ නිශ්චල දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් අධිකරණය වෙත නිකුත් කිරීමට ඔහුට හැකි ය.

(ආ) ඉන් අනතුරුව, දිස්ත්‍රික් අධිකරණය විසින් ගෙවීම පැහැර හැර ඇති බඩු උකස්ගන්නාගේ සියලුම චංචල හා නිශ්චල දේපළ හෝ ඉන් යම් කොටසක් ගෙවිය යුතුව ඇති මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි තහනමට ගැනීම සහ විකිණීම සඳහා පිස්කල්වරයා වෙත බලය පවරමින් සහ නියම කරමින් ඔහු වෙත ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් නිකුත් කළ යුතු අතර එකී තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් (101 වන අධිකාරය ව) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 සහ 297 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5) මෙම වගන්තියේ කාර්ය සඳහා (1) වන උපවගන්තිය යටතේ බඩු උගස්ගන්නා වෙත නිකුත් කළ යම් විස්තරවල ඇතුළත් යම් සටහනක් හෝ යම් දැන්වීමක ඇතුළත් ප්‍රකාශයක හෝ (3) සහ (4) වන උපවගන්ති යටතේ අධිකරණය වෙත නිකුත් කළ සහතිකයක නිරවද්‍යතාව පිළිබඳව මෙම වගන්තිය යටතේ අධිකරණය විසින් කිසිදු නඩු කටයුත්තක දී ප්‍රශ්න කිරීම හෝ පරීක්ෂා කිරීම නොකළ යුතු අතර, (1) වන උපවගන්තිය යටතේ බඩු උගස්ගන්නා වෙත නිකුත් කළ යම් දැන්වීමක ඇතුළත් ප්‍රකාශයක හෝ යම් විස්තරවල ඇති සටහනක හෝ (3) සහ (4) උපවගන්ති යටතේ අධිකරණය වෙත නිකුත් කළ සහතිකයක නිරවද්‍යතාව සලකා බැලීම සහ තීරණය කිරීම සඳහා මෙම වගන්තියේ කිසිවකින් අධිකරණය වෙත බලය පවරා නොදිය යුතු අතර ඒ අනුව ගෙවීම් පැහැර හැර ඇති බඩු උගස්ගන්නා වෙතින් මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු මුදල් නිසි පරිදි ගණනය කොට ඇති බවට සහ එකී මුදල ගෙවීම පැහැර හැර ඇති බවට එය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(6) අවස්ථාවෝචිත පරිදි, (3) වන හෝ (4) වන උපවගන්ති යටතේ බඩු උගස්ගන්නකුට එරෙහිව ආඥාවක් හෝ විධානයක් නිකුත් කර ඇති විට සහ එකී ආඥාවට හෝ විධානයට අනුකූලව ක්‍රියා කිරීම එම බඩු උගස් ගන්නා විසින් පැහැර හැර ඇති විට එකී බඩු උකස්ගන්නා වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් අනතුරුව වරදකරු කිරීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා වන දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(7) මෙම ප්‍රඥප්තිය යටතේ ඇපයක් වශයෙන් ගෙවිය යුතු යම් මුදල් අයකර ගැනීම සඳහා (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ විධිවිධාන අදාළ කර නොගත යුතු ය.

(8) මෙම වගන්තියේ "බඩු උගස්ගන්නා, යන්නට සමාගමක හෝ පුද්ගල මණ්ඩලයක හෝ සංස්ථාවක අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවකු හෝ සංස්ථාපිත නොකළ ආයතනයක සාමාජිකයකු හෝ ධුර දරන්නකු ඇතුළත් වේ.

52. (1) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා, පළාත් කොමසාරිස්වරයාට ලිඛිත දැන්වීමක් මඟින් යම් බඩු උගස්ගන්නකු හෝ නියෝජිතයකු වෙත - *(පළාත් කොමසාරිස්වරයාට තොරතුරු ඉල්ලා සිටිය හැකි බව.)*

(අ) නිශ්චිත පොත් පත්, ව්‍යාපාර ගිණුම් කටයුතු තොග ලැයිස්තු, රෙජිස්ටර, වවුචර් පත්, චෙක්පත්, පොත්, උකස් ලදුපත්, ඔඩපන පිළිබඳ පොත්, විගණන වාර්තා හෝ එකී දැන්වීමේ සඳහන් කර ඇති වෙනත් යම් ලේඛන නිශ්චිත කාලසීමාවක් ඇතුළත ඉදිරිපත් කරන ලෙසත්;

(ආ) බඩු උගස්ගන්නාගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් යම් තොරතුරු සපයන ලෙසත්;

(ඇ) යම් කරුණක් හෝ යම් කාරණා පිළිබඳ විමර්ශනය කිරීම සඳහා දැන්වීමේ සඳහන් වේලාවට, දිනයට සහ ස්ථානයට ඔහුට පැමිණෙන ලෙස හෝ බලය ලත් තැනැත්තකු මඟින් පෙනී සිටින ලෙස, ඉල්ලා සිටිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් කර ඇති යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකු වෙත දැන්වීමක් භාර දෙන ලද විට, එකී විධානය හා අනුකූලවක්‍රියා කිරීම එම බඩු උගස්ගන්නාගේ හෝ නියෝජිතයාගේ කාර්යය විය යුතු ය.

(3) මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා, නිශ්චිත කාලසීමාවක් සඳහා එකී පොත්පත්, ගිණුම්, ව්‍යාපාරික ලැයිස්තු, රෙජිස්ටර, වවුචර්පත්, චෙක් පොත්, උකස් ලදුපත්, ඔඩපන පිළිබඳ පොත් පත්, විගණන වාර්තා හෝ වෙනත් ලේඛන තමාගේ භාරයේ තබා ගැනීමට පළාත් කොමසාරිස්වරයාට බලය පැවතිය යුතු ය.

නඩු පැවරීම.

53. පළාත් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමතිය මගින් හෝ ඒ මත හැර මෙම ප්‍රඥප්තිය යටතේ කිසිදු වරදක් සඳහා නඩු පැවරීම නොකළ යුතු ය.

රහස්‍යතාව.

54. (1) බඩු උකස්කරුගේ යහපත උදෙසා, සෑම උගස්ගන්නකු ම හෝ ඔහුගේ නියෝජිතයකු හෝ බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරයේ යම් නිලධරයකු සහ සෑම තැනැත්තකු ම, ඔහුගේ නිලය හෝ තනතුර හේතුවෙන් එකී ව්‍යාපාරයේ වාර්තා, රෙජිස්ටර, ලේඛන හෝ වෙනත් යම් ලියවිලි වෙත ප්‍රවේශය ලබා තිබීම මත, එහි අන්තර්ගතය සම්බන්ධයෙන් පූර්ණ රහස්‍යතාව සුරැකිය යුතු ය.

(2) *(අ)* එකී ව්‍යාපාරයේ බඩු උගස්ගන්නා හෝ එකී භාණ්ඩ උකස් කරන්නා විසින් අවසර ලබා දී තිබේ නම්;

*(ආ)* එකී බඩු උගස්ගන්නා විසින් හෝ ඔහුට එරෙහිව හෝ බඩු උකස් කරන්නා විසින් හෝ ඔහුට එරෙහිව, පවරා ඇති නීති කෘත්‍යයන් සඳහා; හෝ

*(ඇ)* යම් නීතියක යම් විධිවිධාන මගින් එසේ කිරීම සඳහා ඔහු වෙත නියම කර ඇති විට,

මිස (1) වන උපවගන්තිය යටතේ සඳහන් කර ඇති අනෙකුත් සෑම තැනැත්තකු ම එකී ව්‍යාපාරය සම්බන්ධ කවර වූ හෝ ආකාරයක යම් තොරතුරු යම් පුද්ගලයකු, සංස්ථාවක්, බැංකුවක්, අධිකරණයක්, ආයතනයක්, ව්‍යාපාරයක්, දෙපාර්තමේන්තුවක්, නිලධාරියෙක්, නියෝජිතයෙක්, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙක් හෝ වෙනත් යම් රජයක් වෙත හෝ වෙනත් යම් නෛතික හෝ සාමාන්‍ය තැනැත්තකු වෙත හෝ අධිකරණ වෙත ලබාදීම, අනාවරණය කිරීම, හෙළිදරව් කිරීම නොකළ යුතු ය.

නියෝග.

55. (1) අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ඉටුකිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල ව්‍යාප්තියට අගතිවිරහිතව අමාත්‍යවරයා විසින් පහත සඳහන් සියලු කාරණා හෝ යම් කාරණාවක් සඳහා නියෝග සාදනු ලැබිය හැකි ය -

*(අ)* මෙම ප්‍රඥප්තිය යටතේ නියෝග සාදනු ලැබීම සඳහා නියම කර ඇති හෝ බලය පවරා ඇති සියලු කාරණා සම්බන්ධයෙන්;

*(ආ)* මෙම ප්‍රඥප්තිය යටතේ ඉදිරිපත් කිරීම සඳහා නියම කර ඇති යම් වාර්තාවක ඇතුළත් කළ යුතු තොරතුරු;

*(ඇ)* පළාත් කොමසාරිස්වරයා විසින් තබාගත යුතු හා පවත්වාගෙන යා යුතු පොත් හා රෙජිස්ටර සහ ඒවායේ ඇතුළත් කළ යුතු විස්තර;

*(ඈ)* බඩු උකස්ගන්නකු වශයෙන් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා වන ලියාපදිංචි කිරීමේ ගාස්තු; සහ

*(ඉ)* බලපත්‍රලාභියකු විසින් ඉදිරිපත් කළ යුතු ගාස්තු සහ ඇප තැන්පතු සහ ඇප ගාස්තු තැන්පත් කළ යුතු ආකාරය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සියලුම නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයේ සිට මාස තුනක් ඇතුළත උතුරු පළාත් සභාව වෙත ඉදිරිපත් කර එහි අනුමැතිය ලබාගත යුතු ය.

(4) උතුරු පළාත් සභාව විසින් අනුමත නොකරන ලද සෑම නියෝගයක්ම එම අනනුමතයේ දින සිට ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු ය.

(5) එසේ පරිච්ඡින්න කරනු ලැබූ බවට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

56. යම් කොන්දේසි මත යම් භාණ්ඩ මිල දී ගත හැකි හෝ බේරුම් කර ගත හැකි බව සාධාරණ ලෙස නිගමනය කරනු ලැබිය හැකි ලක්ෂණ සහ ස්වභාවයෙන් වූ යම් ආකාරයක හෝ ව්‍යංග හෝ යටපත් කර ඇති එකඟතාවක් හෝ අවබෝධයක් යටතේ යම් භාණ්ඩ මිල දී ගනු ලබන හෝ භාර ගනු ලබන හෝ ලබාගනු ලබන සහ ඒ සඳහා යම් මුදලක් ගෙවීම හෝ අත්තිකාරම් වශයෙන් ලබාදීම හෝ ණයට ලබාදීම සිදු කරනු ලබන; හෝ භාණ්ඩ මිල දී ගැනීම හෝ විකිණීම සඳහා හෝ ඒ මත ලබාදෙනු ලබන මුදල් අත්තිකාරම් සඳහා ඇප වශයෙන් භාණ්ඩ ලබාගැනීම සඳහා යම් සාප්පුවක් පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තකු මෙම ප්‍රඥප්තියේ කාර්ය සඳහා බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන තැනැත්තකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර තවදුරටත් එවැනි සෑම ගනුදෙනුවක් ම, භාණ්ඩ සඳහා ගෙවීමේ අත්තිකාරම් සහ ණය මුදලක් ම මෙම ප්‍රඥප්තියේ අර්ථය ඇතුළත උකස් කිරීමක්, ඔඩපනයක් සහ ණය මුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය. බඩු උගස්ගන්නකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන බවට සලකනු ලැබීම.

57. පහත පරිදි මෙයින් ප්‍රකාශ කර සිටිනු ලැබේ - ඉතිරි කිරීම්.

(අ) 2017 අංක 06 දරන උතුරු පළාත් බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තිය පනවනු ලැබීම නොතකා (99 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනත යටතේ සාදන ලද මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ බලාත්මකව පැවති සෑම නියෝගයක් ම එම නියෝගය මෙම ප්‍රඥප්තියේ විධිවිධාන හා අනනුකූල නොවන තාක් දුරට මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර එම නියෝග මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන නියෝග මගින් සංශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී උතුරු පළාත තුළ (99 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සෑම බලපත්‍රයක් ම මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මෙම ප්‍රඥප්තියේ 6 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් ලෙස සළකනු ලැබිය යුතු ය;

(ඇ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී උතුරු පළාත තුළ (99 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ 23අ වගන්තිය යටතේ බඩු උගස්ගන්නකු විසින් ඉදිරිපත් කරනු ලබන සියලු ඇප මුදල් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මෙම ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇප මුදල් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඈ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින (99 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනතේ විධිවිධාන යටතේ උතුරු පළාත තුළ බඩු උගස්ගන්නකු විසින් හෝ ඔහුට එරෙහිව පවරනු ලබන සියලු නඩු හා නඩු කටයුතු මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ අවස්ථාවෝචිත පරිදි, එම බඩු උගස්ගන්නා විසින් හෝ ඔහුට එරෙහිව පවරන ලද නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා දිගටම පවත්වාගෙන යාම හා අවසන් කිරීම කරනු ලැබිය හැකි ය;

(ඉ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී උතුරු පළාත තුළ (99 වන අධිකාරය වූ) බඩු උගස්ගන්නන්ගේ ආඥාපනත යටතේ වන බඩු උගස්ගන්නකුගේ සියලු වගකීම් මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මෙම ප්‍රඥප්තිය යටතේ වන එම බඩු උගස්ගන්නාගේ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

58. මෙම ප්‍රඥප්තියේ, අන්‍යාකාරයෙන් විධිවිධාන සළස්වා ඇත්නම් මිස - අර්ථ නිරූපණය.

**"ව්‍යාපාරික ස්ථානය"** යන්නෙන් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන යම් ගෘහයක්, ගබඩා කිරීමේ ගෘහයක්, සාප්පුවක්, සමාගමක්, ඒකාබද්ධ ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් සහ එම ශාඛාවන් පවත්වාගෙන යනු ලබන යම් ස්ථාන අදහස් වේ;

**"ප්‍රධාන ලේකම්වරයා"** යන්නෙන් උතුරු පළාතේ ප්‍රධාන ලේකම්වරයා අදහස් වේ; **"විදේශ සමාගම"** යන්නෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවා ඇති සහ ශ්‍රී ලංකාව තුළ මනා ලෙස පිහිටුවා

ඇති ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇති යම් සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් අදහස් වේ;

"**විදේශ ව්‍යාපාර ආයතනය**" යන්නෙන් -

(i) හවුල්කරුවන් දෙදෙනකුගෙන් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඉන් එක හවුල්කරුවෙකු හෝ හවුල්කරුවන් දෙදෙනාම හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන්නා; හෝ

(ii) හවුල්කරුවන් දෙදෙනකුට වැඩි ගණනකින් සමන්විත වූ ව්‍යාපාරයක් වන විට, ඔවුන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් හවුල්කරුවෙකු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නා වූ ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

"**උකස්කරු**" යන්නෙන් බඩු උගස්ගන්නකු වෙත උකස් කිරීම සඳහා යම් භාණ්ඩයක් භාරදෙනු ලබන යම් තැනැත්තකු අදහස් වේ;

"**ඔඩපනය**" යන්නෙන් බඩු උගස්ගන්නකු වෙත උකස් කරන ලද යම් භාණ්ඩයක් අදහස් වේ;

"**උතුරු පළාතේ පළාත් කොමසාරිස්වරයා**" යන්නෙන් 2014 අංක 1 දරන උතුරු පළාතේ මුදල් ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් කොමසාරිස්වරයා අදහස් වේ;

"**මුදල් වර්ෂය**" යන්නෙන් සෑම වර්ෂයකම අප්‍රේල් මස පළමු වැනි දිනෙන් ආරම්භ වී එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනෙන් අවසන් වන කාලසීමාව අදහස් වේ;

"**පළාත් සභා අරමුදල**" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 19 වන වගන්තිය යටතේ පිහිටුවන ලද උතුරු පළාතේ පළාත් අරමුදල අදහස් වේ;

"**පළාත් නියෝජ්‍ය කොමසාරිස්වරයා**" යන්නෙන් 2014 අංක 1 දරන උතුරු පළාතේ මුදල් ප්‍රඥප්තියේ කාර්ය සඳහා පත් කරන ලද පළාත් නියෝජ්‍ය කොමසාරිස්වරයා අදහස් වේ;

"**අමාත්‍යවරයා**" යන්නෙන් උතුරු පළාතේ කිනම් අමාත්‍යවරයාට මුදල් විෂයය පවරනු ලැබූවේ ද, එම අමාත්‍යවරයා අදහස් වේ;

"**තැනැත්තා**" යන්නට සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"**පොල්මඃකරු**" යන්නට මියගිය පුද්ගලයාගේ දේපල පාලනය කරන තැනැත්තන් වේ. ඊට මෙහි පහත සඳහන් අය ඇතුළත් වේ.

(අ) මියගිය පුද්ගලයාගේ දේපල භාරව සිටින පුද්ගලයා හෝ එම දේපල පරිහරණය කරන පුද්ගලයෙකු;

(ආ) මියගිය පුද්ගලයා හෝ දේපලට අදාළ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය හෝ ප්‍රොබේට් බලපත්‍රය ලබාගැනීම සඳහා දිසා අධිකරණයට ඉල්ලීමක් කර ඇති පුද්ගලයෙකු;

(ඇ) අන්තිම කැමැති පත්‍රයක් යටතේ භාරයක් මත භාරකරුවකු වශයෙන් ක්‍රියා කරන අයෙකු.

"**පළාත් සභාව**" යන්නෙන් උතුරු පළාතේ පළාත් සභාව අදහස් වේ;

"**ශ්‍රී ලාංකික පුරවැසියා**" යන්නෙන් උපතින් හෝ පවත්නා නීතිය යටතේ ශ්‍රී ලංකාවේ පුරවැසියකු බවට පත්වන යම් පුද්ගලයකු අදහස් වේ;

"**නොනිමි භාණ්ඩ**" යන්නට ඇඳීම හෝ පරිභෝජනය කිරීමේ කාර්යය සඳහා සම්පූර්ණ කිරීමට හෝ අවසන් කිරීමට පෙර නිෂ්පාදන තත්ත්වයකට පත් කරනු ලැබීමෙන් පසු යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිර්මාණය කිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා අපේක්ෂා කරනු ලැබ ඇති කවර හෝ ආකාරයේ යම් ද්‍රව්‍ය හෝ මිශ්‍රව හෝ වෙන් වෙන්ව පවතින යම් නිෂ්පාදන අංශයක යම් නිෂ්පාදන භාණ්ඩ ඇතුළත් වේ.

දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

60. මෙම ප්‍රඥප්තියේ දෙමළ, සිංහල හා ඉංග්‍රීසී භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට දෙමළ භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(6 වන වගන්තිය)

I වන උපලේඛනය

**"අ" ආකෘතිය**

බලපත්‍රය

අංකය : ..............................................

උතුරු පළාතේ පළාත් කොමසාරිස් වන මා විසින් ..................- යන ලිපිනයෙහි බඩු උකස්ගන්නකුගේ ව්‍යාපාරය පවත්වාගෙන යාම පිණිස ...................................- යන ස්ථානයෙහි පදිංචි ...................................- යන අයට 2017 අංක 06 දරන උතුරු පළාත් බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ බලපත්‍රයක් මෙයින් නිකුත් කරනු ලැබේ.

මෙම බලපත්‍රයේ වලංගුභාවය ........................ දිනෙන් අවසන් වේ.

දිනය : ..........................

..........................................................
පළාත් කොමසාරිස්
(රබර් මුද්‍රාව)

(21 වන වගන්තිය)

**"ආ" ආකෘතිය**

ඔඩපන පොත

.................................... යන අයගේ ඔඩපන පොත
.................................... යන ස්ථානයේ පදිංචි බඩු උකස්ගන්නා

| උකස් ලදුපත් අංකය හා නිකුත් කරන ලද දිනය | මාසයේ ඔඩපන අංකය | එක් එක් භාණ්ඩය මත ණය මුදල | එක් එක් භාණ්ඩය සම්බන්ධයෙන් අයකළ පොළිය මත ලාභය | උකස්කරුගේ නම | උකස්කරුගේ ලිපිනය | උකස්කරු හිමිකරු නොවන විට හිමිකරුගේ නම | උකස් කරන ලද එක් එක් භාණ්ඩයේ විස්තර | භාණ්ඩයේ හෝ ආභරණ වල බර | උකස් කරන ලද එක් එක් භාණ්ඩයේ වටිනාකම | බේරුම් කිරීමේ දිනය | බේරුම් කරන තැනැත්තාගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | | | | | | | | |
| | | | | | | | | | | | |

(21 වන වගන්තිය)

"ඇ" ආකෘතිය

ඔඩපන පිළිබඳ විකුණුම් පොත

.......................................................................... ..........................................................................
.......................................................................... ..........................................................................

යන අයගේ ඔඩපන පොත
විකිණීමේ දිනය හා ස්ථානය

යන ස්ථානයේ පදිංචි බඩු උකස්ගන්නා
....................................
....................................
..................

වෙන්දේසිකරුගේ නම හා ලිපිනය
....................................
....................................
..................

| ඔඩපන පොත අනුව ඔඩපනයේ අංකය | උකස් කරන ලද දිනය | උකස්කරුගේ නම | ණය මුදල | අයවිය යුතු පොළිය | වෙන්දේසිකරු විසින් ඔඩපනය විකුණන ලද මුදල | මිලදී ගන්නාගේ නම හා ලිපිනය |
|---|---|---|---|---|---|---|
| | | | රු. ශත | රු. ශත | රු. ශත | |

(22 වන වගන්තිය)

"ඈ" ආකෘතිය

උකස් ලදුපත

උප පත්‍රිකා අංකය:
(බඩු උකස්ගන්නා විසින් රඳවා ගත යුතුය)

දිනය:

බඩු උකස්ගන්නාගේ නම හා ලිපිනය:
............................................................
............................................................

මුල් පත්‍රිකා අංකය:
.................................. දිනය

.................................................... යන අය
(උකස්කරුගේ නම හා ලිපිනය)
................ වන මෙම දිනයේ දී රුපියල් ..............
.......... වටිනාකමින් යුත් .............. රුපියල් ............
....... ක මුදලක් සඳහා පහත අත්සන් කරනු ලබන අය

...............................................................
...............................................................
...................... හි පදිංචි
(උකස්කරුගේ ලිපිනය)
ජාතික හැඳුනුම්පත් අංක ......................
දරන පහත අත්සන් කරනු ලබන මා
..................................වන
ඉහත කී බඩු උකසගන්නා වෙතින්
රුපියල් ..................වටිනාකමින්
යුත් .............. රුපියල් ...................
..................... ක මුදලකට මෙදින උකස්
කරන ලදී.

අත්සන
(රබර් මුද්‍රාව)

වෙත (බඩු උකස්ගන්නාගේ නම හා ලිපිනය) උකස්
කරන ලදී.

............................................................................
............................................................................

(බඩු උකස්ගන්නාගේ හෝ ඔහුගේ සේවකයකුගේ හෝ
බඩු උකස්ගන්නාගේ නියෝජිතයකුගේ අත්සන)

නම ....................................................................
අත්සන ..............................................................
(අත්සන් කළ නොහැකි විට වම් මාපට ඇඟිලි සලකුණ)

(26 වන වගන්තිය)

"ඉ" ආකෘතිය

**උකස් ලදුපතේ පත්‍රිකාව මත උකස්කරුගේ අත්සන පිටසන් කිරීමෙන් තොරව 24 වන වගන්තිය යටතේ උකස් ලදුපතේ පත්‍රිකාව භාරදෙනු ලබන විට කළ යුතු ප්‍රකාශනය**

.................................... හි පදිංචි ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ අංක ................. දරන .................................... වන මා (අ/ආ), බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ ප්‍රකාරව, බඩු උකස්ගන්නා වන ................................... යන අයගේ සාප්පුවේ ................................... යන අය පහත විස්තර කර ඇති භාණ්ඩය/භාණ්ඩ උකස් කර, ඒ සඳහා වන උකස් ලදුපතේ පත්‍රිකාව ලබාගත් බවත්, එම ඔඩපනය බේරුම් කිරීමේ කාර්යය සඳහා එම ................................... යන අය (උකස්කරු) මියයාමේ හේතුවෙන්/ නීතිමය නොහැකියාවකට පත්වීමේ හේතුවෙන්, එනම් .................................... (නීතිමය නොහැකියාවේ ස්වභාවය), එම (උකස්කරුගේ) අත්සන ඒ මත නිසි ලෙස පිටසන් කර, බඩු උකස්ගන්නා වෙත උකස් ලදුපතේ පත්‍රිකාව භාරදීමට හැකියාවක් නොමැති බවත් භක්තියෙන් යුතුව අවංකව ප්‍රකාශ කරමි.

"අ", "ආ"ගේ අත්සනඃ .......................................................

ඉහත සඳහන් භාණ්ඩය/භාණ්ඩ පහතින් වේ.
.........................................................................
.........................................................................

................................................ ("ඇ", "ඈ") වන මා, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත ප්‍රකාශනය සිදු කරනු ලබන තැනැත්තා ......................................... හි පදිංචි ..................................... යන අය ("අ", "ආ") ................................... බව, මා හොඳාකාරව දන්නා බව භක්තියෙන් යුතුව අවංකව ප්‍රකාශ කරමි.

"ඇ", "ඈ"ගේ අත්සනඃ .....................................................

20........ වසරේ ................................... මස ................. වැනි දින මා ඉදිරියේ දී ප්‍රකාශ කරන ලදී.

.........................................................................
සමාදාන විනිශ්චයකාර
(රබර් මුද්‍රාව)

(28 වන වගන්තිය)

**"ඊ" ආකෘතිය**

**උකස් ලදුපතේ පත්‍රිකාව නැති වූ විට ඉදිරිපත් කළ යුතු ප්‍රකාශනය**

මෙම ප්‍රකාශනය සාවද්‍ය ප්‍රකාශනයක් වන්නේ නම්, එය කරනු ලබන තැනැත්තා දඬුවමකට යටත් විය යුතු ය.

....................................................................... හි පදිංචි ජාතික හැඳුනුම්පතේ/ගමන් බලපත්‍රයේ අංක ................. දරන ................. වන මා (අ/ආ), බඩු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ ප්‍රකාරව, බඩු උකස්ගන්නා වන ................. යන අයගේ සාප්පුවේ ................. යන අය පහත විස්තර කර ඇති භාණ්ඩය/භාණ්ඩ උකස් කර, ඒ සඳහා වන උකස් ලදුපතේ පත්‍රිකාව ලබාගත් බවත්, එම ඔඩපනය බේරුම් කිරීමේ කාර්යය සඳහා එම ................. යන අය (උකස්කරු) මියයාමේ හේතුවෙන්/ නීතිමය නොහැකියාවකට පත්වීමේ හේතුවෙන්, එනම් ................. (නීතිමය නොහැකියාවේ ස්වභාවය), එම (උකස්කරුගේ) අත්සන ඒ මත නිසි ලෙස පිටසන් කර, බඩු උකස්ගන්නා වෙත උකස් ලදුපතේ පත්‍රිකාව භාරදීමට හැකියාවක් නොමැති බවත් භක්තියෙන් යුතුව අවංකව ප්‍රකාශ කරමි.

"අ","ආ"ගේ අත්සනඃ .......................

ඉහත සඳහන් භාණ්ඩය/භාණ්ඩ පහතින් වේ
.........................................................................
.........................................................................

..................................................... ("ඇ", "ඈ") වන මා, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත ප්‍රකාශනය සිදු කරනු ලබන තැනැත්තා ....................................................................... හි පදිංචි ................................ යන අය ("අ", "ආ") ...........................................- බව, මා හොඳාකාරව දන්නා බව භක්තියෙන් යුතුව අවංකව ප්‍රකාශ කරමි.

"ඇ","ඈ"ගේ අත්සනඃ .......................

20........ වසරේ ........................ මස ................... වැනි දින මා ඉදිරියේ දී ප්‍රකාශ කරන ලදී.

.........................................................................
සමාදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්
(රබර් මුද්‍රාව)

(32 වන වගන්තිය)

**"උ" ආකෘතිය**

ලදුපත

දිනය .................................

........................................................ අංක දරන ඔඩපනය බේරුම් කිරීමේ දී ලබා ගතිමි.

| | රු. ශත | රු. ශත |
|---|---|---|
| ණය මුදල | ................ | ................ |
| ලාභය හෝ පොලිය | ................ | ................ |
| ව්‍යාපාර පිරිවැටුම් බදු | ................ | ................ |

| | |
|---|---|
| | |
| | |

..................................................
උකස්කරුගේ අත්සන

(20 වන වගන්තිය)

## II වන උපලේඛනය

**පොළී අනුපාතිකය**

ණයට දෙනු ලබන සෑම රුපියලක් හෝ එහි කොටසක් සඳහා පොලී අනුපාතිකය, සෑම මාසයක් සඳහා හෝ එහි කොටසකට ශත දෙකක් විය යුතු ය.

**බදු ගෙවීම**

යම් ඔඩපනයක් මත ලබාදෙනු ලබන ණය මුදලක් සම්බන්ධයෙන් බඩු උකස්ගන්නා විසින් යම් ලිඛිත නීතියක් යටතේ යම් බද්දක් ගෙවිය යුතු විට, එම බදු මුදල උකස්කරුගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

**වැඩි වූ පොළී මුදල අයකර ගැනීම සීමා කිරීම**

යම් දිනයක සිට වැඩි වූ පොළී මුදලට බඩු උකස්ගන්නා හිමිකම් ලබන විට, උකස්කරු විසින් එම දිනයට පෙර පෙරාතුව ම වූ දිනයේ දී පෙ:ව: 8.00 සහ ප:ව: 8.00 අතර කාලය තුළ දී බඩු උකස්ගන්නාගේ ව්‍යාපාරය වසා තැබීම හේතුවෙන්, එම දිනයට පෙර එම ඔඩපනය බේරුම් කිරීම සඳහා තමාට නොහැකි වූ බව ඒ සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති සිවිල් අධිකරණයක් සෑහීමට පත්වන අයුරින් කරුණු පෙන්වා දෙනු ලැබූ විට, වැඩි වූ එම පොළී මුදල අයකර ගැනීම නොකළයුතු ය.

උකස් ලදුපතට අදාළ ඔඩපනය උකස් කරන ලද දිනයේ සිට මාස දොළහක කාලසීමාවක් ඇතුළත බේරුම් කරනු නොලැබූ විට, එය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට යටත් විය යුතු ය.

විකිණීමෙන් ලැබුණු යම් අතිරික්ත ලාභයක් ඇතිවිට සහ එම විකිණීමේ දිනයේ සිට අවුරුදු එකක කාලසීමාව ඇතුළත ඒ සඳහා උකස්කරු විසින් හිමිකම් පෑමක් ඉදිරිපත් නොකරන ලද විට, එම ලාභය උකස්කරුගේ බැරට පළාත් සභා අරමුදලේ තැන්පත් කළ යුතු ය.

(32 වන වගන්තිය)

## III වන උපලේඛනය

ඔඩපන වෙන්දේසියේ විකිණීම සම්බන්ධයෙන් වන නියෝග

(1) වෙන්දේසිකරු විසින් සියලු ඔඩපන මහජන ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු ය.

(2) (අ) බඩු උගස්ගන්නාගේ නම සහ ව්‍යාපාර ස්ථානය

(ආ) එක් එක් ඔඩපනය උකස් කරන ලද මාසය

(ඇ) උකස් කරන ලද අවස්ථාවේ දී ඔඩපන පොතේ ඇතුළත් කර ඇති එක් එක් ඔඩපනයේ අංකය

ඇතුළත් ඔඩපන පිළිබඳ නාමාවලියක් වෙන්දේසිකරු විසින් පළකළ යුතු ය.

(3) නාමාවලි පොතෙහි ඇතුළත් එක් එක් බඩු උගස්ගන්නකුගේ ඔඩපන වෙනත් යම් බඩු උකස්ගන්නකුගේ යම් ඔඩපනවලින් වෙන්කොට පෙන්නුම් කළ යුතු ය.

(4) වෙන්දේසිකරු විසින් විකිණීම පිළිබඳව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල අවම වශයෙන් එක් වතාවක් හෝ දැන්වීමක් පළකළ යුතු අතර එම විකිණීම සිදු කරනු ලබන ප්‍රදේශය ඇතුළත පුද්ගලයන් රැස්වන ස්ථානවල දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතු ය. එම දැන්වීම්වල පහත විස්තර ඇතුළත් විය යුතු ය.

(අ) බඩු උගස්ගන්නාගේ නම සහ ව්‍යාපර ස්ථානය; සහ

(ආ) ඔඩපන උකස් කරන ලද මාසය

(5) එම දැන්වීම එකම පුවත්පතේ දින දෙකක දී පළකළ යුතු අතර දෙවන දැන්වීම විකිණීමේ පළමු දිනයට අවම වශයෙන් දින දහයකට පෙර පළකළ යුතු ය.

(6) යම් බඩු උකස්ගන්නකු විකිණීමේ දී ලන්සු ඉදිරිපත් කරනු ලබන විට වෙන්දේසිකරු විසින් එම විකිණීමේ දී වෙනත් තැනැත්තන්ගෙන් ලන්සු භාරගනු ලබන ආකාරයට හැර වෙනත් යම් ආකාරයකට ඔහුගේ ලන්සු ඉදිරිපත් කිරීම භාර නොගත යුතු අතර බඩු

උකස්ගන්නකු විසින් යම් භාණ්ඩයක් මිල දී ගනු ලැබූ විට වෙන්දේසිකරු විසින් වහාම එම භාණ්ඩයේ මිල දී ගන්නා වශයෙන් බඩු උකස්ගන්නාගේ නම පැහැදිලිව ඇසෙන ලෙස ප්‍රකාශයට පත් කළ යුතු ය.

(7) වෙන්දේසිකරු විසින් එම බඩු උගස්ගන්නාගේ ඔඩපන විකුණනු ලැබූ මුදල සඳහන් කරමින් එම බඩු උගස්ගන්නාගේ ඔඩපන සම්බන්ධයෙන් වන නාමාවලියේ පිටපතක් ඔහු විසින් අත්සන් කර දින දාහතරක් ඇතුළත බඩු උගස්ගන්නා වෙත භාරදිය යුතු ය.

(8) බඩු උගස්ගන්නා විසින් එවැනි සෑම නාමාවලියක් ම වෙන්දේසියෙන් පසු අවම වශයෙන් අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා ආරක්ෂා කර තබාගත යුතු ය.

(51 වන වගන්තිය)

**IV වන උපලේඛනය**

"අ" ආකෘතිය

තැන්පතු ගෙවීම පැහැර හැරීමේ දී බඩු උගස්ගන්නා වෙත භාරදිය යුතු දැන්වීම

පළාත් කොමසාරිස් කාර්යාලය,
.....................................................

..................................... මයා/මිය
.....................................
.....................................
මහත්මයාණෙනි/මහත්මියෙනි,
බඩු උගස්ගන්නාගේ නම :-
ව්‍යාපාර ස්ථානයේ ලිපිනය :-

**ඇප වශයෙන් වූ තැන්පතුවෙහි ගෙවීම පැහැර හැරීම**
**බලපත්‍ර අංකය : .....................................**

ඔබ විසින් 2017 අංක 06 දරණ උතුරු පළාත් බඩු උගස්ගන්නන්ගේ ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, තැන්පතුවක් සඳහා ගෙවීම පැහැර හැර ඇති බවට තීරණය කරනු ලැබ ඇත. ඒ සම්බන්ධයෙන් වන විස්තර මේ සමඟ අමුණා ඇති 2වන ආකෘතියෙන් දක්වා ඇත.

මෙම තැන්පතුව දැනටමත් ගෙවා ඇත් ද යන්න පිළිබඳව අප්‍රමාදව මා වෙත දැනුම් දෙන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. එසේ ගෙවා ඇත්නම් කරුණාකර ඒ පිළිබඳව ලදුපත්, ලේඛන හෝ යම් ලිපියක් මා වෙත ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. ගෙවීම් කර නොමැති නම්, මේ සමඟ අමුණා ඇති 2 වන ආකෘති පත්‍රයේ සඳහන් මුළු මුදල පළාත් කොමසාරිස්වරයාගේ කාර්යාලය වෙත ගෙවන ලෙස මෙයින් ඉල්ලා සිටින අතර ඒ පිළිබඳව මා වෙත ඊළඟ සති දෙක ඇතුළත දැනුම් දෙන ලෙස හෝ මෙම දැන්වීම ලැබුණු දිනයේ සිට දින දාහතරක් ඇතුළත පළාත් කොමසාරිස්වරයාගේ නමට ලියන ලද 2වන ආකෘතියේ සඳහන් මුළු මුදල සඳහා වන චෙක්පතක් ලියාපදිංචි තැපෑලෙන් මා වෙත එවන ලෙස ඔබට මෙයින් දන්වමි.

මෙම දැන්වීමට අමුණා ඇති විස්තර පිළිබඳ වැඩිදුරටත් වූ තොරතුරු ඔබට අවශ්‍ය වන්නේ නම්, මෙම දැන්වීමේ දිනයේ සිට සති දෙකක් ඇතුළත මෙම කාර්යාලය වෙත ඔබ විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මඟින් එම තොරතුරු ලබාගත හැකි ය.

මෙම දැන්වීම සඳහා ඔබගෙන් ලිඛිත පිළිතුරක් නොමැති නම් හෝ ඊළඟ සති දෙක ඇතුළත ගෙවීම සිදු කිරීම සඳහා ඔබගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොමැති නම්, මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව එම ගෙවීම පැහැර හැර ඇති තැන්පතුව අයකර ගැනීම සඳහා ඔබට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණයේ හෝ දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පැවරීමට කටයුතු කරනු ලබන බව ඔබ වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

මෙයට විශ්වාසී,
පළාත් කොමසාරිස්,

පළාත් කොමසාරිස්වරයාගේ කාර්යාලය
.................................. (මුද්‍රාව)
..................................
දිනය :-

"අදාළ නොමැති කවරක් හෝ ඉවත් කරන්න."

**"ආ" ආකෘතිය**

51 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන විස්තර

1. ගෙවීම පැහැර හැර ඇති බඩු උකස්ගන්නාගේ නම : ..........................................................................................................
2. ව්‍යාපාර ස්ථානයේ නම හා ලිපිනය : ..........................................................................................................
3. බලපත්‍ර අංකය : ..........................................................................................................
4. ගෙවීම පැහැර හැර ඇති මුළු මුදල : ..........................................................................................................
5. ගෙවීම පැහැර හැර ඇති කාලසීමාව : ..........................................................................................................
6. කිසියම් ගෙවීමක් කර ඇත්නම්, එම මුදල : ..........................................................................................................
7. ගෙවිය යුතු ඉතිරි මුදල : ..........................................................................................................

පළාත් කොමසාරිස්
(මුද්‍රාව)

පළාත් කොමසාරිස්වරයාගේ කාර්යාලය
......................................................
......................................................

දිනය ..............................................

**"ඇ" ආකෘතිය**

51 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වන සහතිකය

1. ගෙවීම පැහැර හැර ඇති බඩු උකස්ගන්නාගේ නම : ..........................................................................................................
2. ව්‍යාපාර ස්ථානයේ නම හා ලිපිනය : ..........................................................................................................
3. තැන්පතුව ගෙවීම පැහැර හැර ඇති කාල සීමාව : ..........................................................................................................
4. ගෙවීම පැහැර හැර ඇති තැන්පතු දායකත්වයේ මුළු එකතුව :..........................................................................................................
5. කිසියම් ගෙවීමක් කර ඇත්නම්, එම මුදල : ..........................................................................................................
6. ගෙවිය යුතු ඉතිරි මුදල : ..........................................................................................................

පළාත් කොමසාරිස්
(මුද්‍රාව)

පළාත් කොමසාරිස්වරයාගේ කාර්යාලය
......................................................
......................................................

දිනය ..............................................

04 - 664

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.